2026.09.08 වන දින සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව.
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 සැප්තැම්බර් මස 09 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

සහභාගීත්වය:-

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැනිණිය

08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැනිණිය

09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා

10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා

12.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා

13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය

15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා.

16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

17. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය

18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එල්. ජයසේකර මැතිතුමා

20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා

21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා

23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා

24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය

25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා

26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා

27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා

28.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී. ඒ. කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය

30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා

31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

32.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුම

33. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

34.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්. ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

35.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය

නොපැමිණීම්

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. එච්. එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

කාර්ය මණ්ඩලය

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා	- ලේකම්
02. ජී.අයි.කේ.ජයතුංග මිය	- සංවර්ධන නිලධාරී
03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය	- සෞඛ්‍ය කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීරුන්, මන්ත්‍රීවරියන්, මාධ්‍යවේදීන්, සභා ලේකම් හා කාර්යාලයේ නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ) (i) 2026.07.30 වන දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් 2026.07.30 වන දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

2026.07.30 වන දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, 2026.07.30 වන දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(අ) (ii) 2026.08.11 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් 2026.08.11 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

පසුගිය සභා වාරයේදී තමන් විසින් කථා කිරීමේදී ගරු උප සභාපතිතුමා විසින් ඊට විරුද්ධව අදහස් ප්‍රකාශ කළ බවත් එම අවස්ථාව සම්බන්ධයෙන් වාර්තාවේ ලියවී නොමැති බවත්, මෙය සද්භාවයෙන් කතා කරන බවත් එහි අඩුපාඩුව කුමක්ද කියා දැන ගැනීමට අවශ්‍ය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සාමාන්‍ය වචන හුවමාරුවක් සිදු වූ බැවින් එය සභා වාර්තාවට ඇතුළත් විය යුතු ද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ආණ්ඩු පක්ෂය කතා කරන දේ තිබෙන නිසාත් විපක්ෂය කතා කරන දේ නොමැති නිසා විමසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
එය යෝජනාවක්වත්, වාර්තාවේ සංශෝධනයක්වත් නොව වචන හුවමාරුවක් පමණක් බැවින් එය වාර්තාවට ඇතුළත් නොවුවායැයි ගැටලුවක් නොමැති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

2026.08.11 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, 2026.08.11 වන දින පවත්වන ලද සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.- නැත.

(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා අද දින අසනීප තත්ත්වයක් හේතුවෙන් සභාවට නොපැමිණෙන බව දන්වා ඇති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ බව ලිඛිතව දන්වා ඇතිද යන්න ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා 2026-09.08 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපියක් යොමුකර තිබෙන බවත්, එම ලිපිය මේ මොහොතේ සභාගත කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

2026-09.08 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

2026.09.08 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණීය නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා වෙත නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම සඳහා අනුමතිය ලබා දෙන ලදී.

(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම - නැත.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - නැත.

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

01 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා

හිදුරංගල දොලේවත්ත පාර මුල් කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා.

මෙයට මූලික වන කරුණ වන්නේ කුඹුරු ඉඩම් අස්වැද්දීමේ වැඩසටහන යටතේ අමුණක් සංවර්ධනය කිරීමට තිබෙන බවත්. එම කුඹුරු අස්වැද්දීමට සමගාමීව මෙම පාර කොන්ක්‍රීට් කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීඑච්.එල්.ජයසේකර මැතිතුමා ඉල්ලීමක් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

තමන් අවස්ථා ගණනාවකදීම සංවර්ධන යෝජනා ඉදිරිපත් කළ බවත්, සභාපතිතුමාද ප්‍රකාශ කර ඇති බවත්, ඒ සම්බන්ධව ලිපි මඟින් ද සභාවේ ප්‍රතිපාදන නොමැති බව දන්වා ඇති බවත්, මෙම න්‍යාය පත්‍රයේ ද විශාල සංවර්ධන යෝජනා ප්‍රමාණයක් තිබෙන බවත් එම එක් යෝජනාවක්වත් සිදු නොකරන ලෙස තමන් නොපවසන බවත් විපක්ෂය විසින් ඉදිරිපත් කරන යෝජනා සඳහා පමණක් ප්‍රතිපාදන නොමැතිව සිදු කළ නොහැකි බව පවසා ලිපි ලැබෙන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

(සෝෂාව) සභාවේ න්‍යාය පත්‍රය අනුව කටයුතු කරන ලෙස රීති ප්‍රශ්නයක් යොමු කරමින්, ගරු සභාපතිතුමා ඇතුළු සභාවේ සිටින සියලුම මන්ත්‍රිවරු, මන්ත්‍රිවරියන් ඇහැලියගොඩ සිටින ප්‍රධාන පුරවැසියන් බවත්, සභාව පවත්වාගෙන යා යුතු ක්‍රමවේදයක් තිබෙන බවත්, ඊට අදාළ න්‍යාය පත්‍රයක් පවතින බවත්, වෙනත් අදහසක් තිබෙනවා නම් එය මන්ත්‍රිවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී එය සිදු කළ යුතු බවත්, (සෝෂාව) ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා.

රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කළ විට ගරු සභාපතිතුමා විසින් එම රීති ප්‍රශ්නයට පිළිතුරු ලබා දිය යුතුයි යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අමතර යෝජනා ඉදිරිපත් කරනවා නම් සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී සිදු කළ යුතු බවත්, එය සභා රීතිවල සඳහන්ව ඇති බවත්, දැන් සාකච්ඡා වන්නේ කල්දී ඇති යෝජනා බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මෙවර න්‍යාය පත්‍රයේ විශාල සංවර්ධන යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා විපක්ෂ කණ්ඩායම විසින් කිසිදු විරුද්ධත්වයක් ප්‍රකාශ නොකරන බවත්, තම කාර්යය නොකෙරුනත් යෝජනා න්‍යාය පත්‍රයට ඉදිරිපත් කිරීමට හෝ අවස්ථාව ලබාදෙන ලෙසත්, බොහොම සද්භාවයෙන් මහජනතාවගේ ප්‍රශ්න රැගෙන එන බවත්, පක්ෂයද විපක්ෂය ද කියා භේදයක් නොමැති බවත්, සියලු දෙනා ම මහජන ඡන්දයෙන් පත් වී ඇති මහජන නියෝජිතයන් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමස්ථ ඇහැලියගොඩට ම, ඇහැලියගොඩ ජනතාවගේ නායකයා ගරු සභාපතිතුමන් බවත්, ගරු සභාපතිතුමාට යෝජනා ඉදිරිපත් කළ විට එය සභාවේ ප්‍රතිපාදන නොමැති බව පවසා ප්‍රතික්ෂේප වූ බව දන්වා ලිපියක් ආණ්ඩු පක්ෂයට නොමැතිව විපක්ෂයට පමණක් ලැබෙන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගියවර සභා වාරයේදීද මේ පිළිබඳව පෙන්වා දුන් බවත් සභාවේ ප්‍රතිපාදන නොමැති බව පවසා ලිපි ලැබී ඇති බවත්, යෝජනාව නොකෙරුණත් න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කිරීමට විපක්ෂ කණ්ඩායමට අවස්තාව ලබා දෙන ලෙසත්, එසේනම් මෙලෙස ආණ්ඩු පක්ෂයේ යෝජනා පමණක් න්‍යාය පත්‍රයට ඇතුළත් වී ඇත්තේ ඇයි ද යන්නත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

විපක්ෂයේ මන්ත්‍රිවරුන්ට පමණක් නොව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුන්ගේ යෝජනා ද ප්‍රතික්ෂේප කර ඇති බවත්, එම මන්ත්‍රිවරුන්ට ද ලිපි මඟින් දැනුවත් කිරීම් සිදු කර ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් මෙවර සභා න්‍යාය පත්‍රයට යෝජනාවක් යොමු කළේද යන්න , ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

යෝජනා ඉදිරිපත් කළත් යෝජනා ප්‍රතික්ෂේප කරන බැවින්, තමන් විසින් මෙවර සභාවට යෝජනා ඉදිරිපත් නොකළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. (සෝෂාව)

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙවර සභාවට යෝජනා ඉදිරිපත් නොකිරීමට හේතුව කුමක්දැයි ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගෙන් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගියවර සභාවට ද මෙම ලිපිය ඒ ආකාරයට ම ඉදිරිපත් කළ බවත්, තමන් විසින් ගියවර ප්‍රකාශ කළ දේ සභා වාර්තාවේද ලියවී තිබෙන බවත්, යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවේ ප්‍රතිපාදන නොමැති බව දන්වා ඇති බවත්, ප්‍රතිපාදන නොමැති බව ගරු සභාපතිතුමා පිළි ගන්නවා නම් මේ න්‍යාය පත්‍රයට සංවර්ධන යෝජනා ඉදිරිපත් කර ඇත්තේ කුමන පදනමකින් ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විමසන ලදී. (සෝෂාව)

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

විශාල මුදලක් වැය වෙන, යෝජනා ඇතුළත් නොකරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මීටර් 20,30 පමණ යෝජනා ඉදිරිපත් කර ඇති බවත්, එම යෝජනා එකක්වත් තමාගේ ගෙදර ගෙනියන්න, තමාගේ ගෙදරට යන පාරක්වත් නොවන බවත්, මෙම යෝජනා මඟින් තමන් ඉදිරිපත් කළ පාරවල් NPP පක්ෂයේ නිවෙස් සඳහා ගමන් ගන්නා පාරවල් බවත්, ලකුණු දා ගැනීම සඳහා මෙම යෝජනා ඉදිරිපත් නොකළ බවත්, තමන් එම මාර්ගවල ගමන් ගැනීමේ දී, ඒ ප්‍රදේශයේ ජනතාවට ගමන් ගැනීමට අපහසුයැයි හැගෙන බැවින් එම යෝජනා ඉදිරිපත් කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

යෝජනාවට අදාළව පමණක් මේ අවස්ථාවේ කතා කරන ලෙසත් පෞද්ගලික කතා වාරයේදී අදහස් දැක්විය හැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

විපක්ෂයේ යෝජනා ක්‍රියාත්මක නොවුණත්, යෝජනා න්‍යාය පත්‍රයට යොමු කිරීමට හෝ අවස්ථාව ලබාදෙන ලෙසත්, එවිට පක්ෂ විපක්ෂ භේදයක් ඇති නොවන බවත්, කොටියාශයේ මන්ත්‍රීවරයා වන එච් .ආරියදාස මැතිතුමා මේ වෙනුවෙන් කතා කළ යුතු බවත්, කොටියාශය වෙනුවෙන් තමා මෙලෙස කතා කරන බවත්, තමන්ගේ පුද්ගලික කාර්යන් සිදු කර ගැනීමට නොවන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. (සෝෂාව)

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

තම්මෝවිට චිත්ත විවේකා ශ්‍රමයට පිවිසෙන මාර්ගයේ ලයනල් මහතාගේ නිවස ඉදිරිපිට කොටසේ ඉවුර බාදනය වන ස්ථානයට මීටර් 10 ක් පමණ කොන්ක්‍රීට් බැම්මක් යොදා මාර්ගයේ ආරක්ෂාව තහවුරු කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා.

මෙම මාර්ගයත් සමඟම තිබෙන ඉවුර පසුගිය වැසි දිනවල ගැලවී ගොස් ඇති බවත්, මාර්ගයේ ආරක්ෂාව පිළිබඳව සලකා බලා මේ පිළිබඳ පිළියමක් යෙදිය යුතු බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

03 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

යායපාර තුන්වන පටුමගේ විජයනාත මහතාගේ නිවස දක්වා සංවර්ධනය කර ගැනීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

04 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

දෙයියාගල බෝල කෝඩ් එක අසලින් කජුගස්වත්ත මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

04 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

සුදු පාලම අසලින් කිරිඅතුල මාර්ගයේ අත්‍යවශ්‍ය කොටස් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

05 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ස්ථාවර වත්කම් සුරක්ෂිත කිරීම යටතේ, කාර්යාල පරිශ්‍රය තුළ විදුලි මීටර ආවරණ අවධානම් රහිත ආකාරයට සකස් කිරීම, ජල පීලි හා අපවහන ජල නළ අලුත්වැඩියා කිරීම, ඉහළ මහලයට සම්බන්ධ පඩිපෙළ ආශ්‍රිත අත්වැට අලුතින් ඉදි කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

06 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය

මදටියගහහේන- පනුගලහේන මාර්ගයේ ජයන්ත මහතාගේ නිවස අසල හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

මෙවන විට සංවර්ධන යෝජනා 05ක් පැමිණි බවත් ඒ සඳහා මුදල් ප්‍රතාපාදන තිබේද යන්න පිළිබඳවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසා සිටින ලදී.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මුදල් ලැබුණොත් පමණක් සිදු කරන බවට ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුවත් කර ඇති බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

විපක්ෂ විසින් යෝජනා ඉදිරිපත් නොකිරීමටත් ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කිරීමටත් හේතුව කුමක්ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් විමසා සිටින ලදී. (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමාගේ මුවින් මේ අවස්ථාවේදී මුදල් නොමැති බව පැවසූ බවත්, මේ සම්බන්ධව විපක්ෂයක් වශයෙන් හිනා යාම සාධාරණ නොවන්නේ ද යන්නත්, මෙම සංවර්ධන යෝජනා කුමන පැත්තකින් ගෙන ආවත් එය සිදු විය යුතු කාර්යයන් බවත්, විපක්ෂයේ යෝජනා ද ලබා ගන්නා ලෙසත් ගරු සභාපතිතුමන්ව තවමත් විශ්වාස කරන බවත්, ගරු සභාපතිතුමන් හොර බොරු නොකරන බවට විශ්වාස කරන බවත්, බොහෝ දේවල් පැවසීමට ඇතත් සිත් රිද්දා ගැනීමට නොහැකි නිසා නොපවසන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

07 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

පහත සඳහන් මාසවල දෛනික සේවකයින්ගේ හා නිලධාරින්ගේ වැටුප් ලෙස ගෙවා ඇති ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ස්ථිර සේවක - අගෝස්තු මාසය - රුපියල් 5,842,831.64
දෛනික සේවක - ජූලි මාසය - රුපියල් 1,252,754.75

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

08 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා

පොත්ත කුඹුර පාරේ කැඩී ගොස් ඇති කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

09 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමත් ඔවුනට සමාජයේ සමාන අවස්ථා ලබාදීමත් අරමුණු කොට, අබාධ සහිත තැනැත්තන් ප්‍රවේශ වන පොදු ගොඩනැගිලිවලට ප්‍රසිද්ධ ස්ථානවලට හා පොදු සේවා සඳහා ප්‍රවේශ පහසුකම් ඇති කිරීම සඳහා නිකුත් කර

ඇති 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්‍රවේශ නියෝග ගැලසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී.ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව හා ප්‍රධාන කාර්යාලය ස්ථාපිත මහල් තුනකින් සමන්විත වූ ගොඩනැගිල්ල සඳහා ද, ආබාධිත ප්‍රජාව වෙත ප්‍රවේශ පහසුකම් සැලසීමේ අරමුණින්, එමගින් 09 දෙනෙකු රැගෙන යා හැකි වන විදුලි ඝෝපානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ආබාධිත පුද්ගලයින් පමණක් නොව වරිපනම් බදු ගෙවීමට බොහෝ පිරිස් පැමිණෙන බවත්, සභාවට පැමිණ යම් කාර්යක් සිදු කර ගැනීමට මහල් දෙකක් ඉහළට පැමිණිය යුතු බවත්, එය නැගීමට අපහසු වන පුද්ගලයින්ද සිටින බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, මේ සඳහා සභාවේ මුදල් වැය නොවන බවත්, මේ සඳහා සමාජ සේවා අමාත්‍යාංශයෙන් මුදල් ලබා දෙන බවද ඒ සඳහා ඔවුන් ඇස්තමේන්තුවක් ඉල්ලා සිටි බවද, ඇස්තමේන්තුව පමණක් නොවන බැවින් සභා තීරණයක් ද අවශ්‍ය බැවින් මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළ බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

එම විදුලි ඝෝපානය ස්ථානගත කිරීමට සැලසුම් කර ඇත්තේ කුමන ස්ථානයේ ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
ස්ථානයක් තීරණය කිරීම තවම සිදු වී නොමැති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

10 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

හොරගොඩ ක්‍රීඩා පිටියට යන මාර්ගයේ පිට්ටනියේ දොරටුව අසල තෙක් මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

එම ස්ථානයේ රුපියල් ලක්ෂ 20 වැඩ අවසන් කර ඇති බවත්, තවත් රුපියල් ලක්ෂ එකයි හැත්තැවක, එකයි අසුවක පමණ ඉතුරුවක් තිබෙන බව දැන ගැනීමට ලැබුණු බවත්, දොරටුව ආසන්න දක්වා මීටර් 30 ක ප්‍රමාණයක් පමණ ඉතිරිව ඇති බවත්, ගරු උපසභාපතිතුමා තමාට කාපට් යොදා සකස් කරන කතාවක් කියූ බවත්, කාපට් යොදන කාර්ය කෙසේ වෙතත් එහි ඉතිරි කොටස සකසා දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම ස්ථානය බැලීම සඳහා තමන්ද පැමිණි බවත් එම ප්‍රතිපාදන වලින් රු. 184,000.00ක් ඉතිරිව ඇති බවත්, ඉතිරි කොටස සභාවේ ප්‍රතිපාදන යොදා සිදු කර ගැනීමට හැකි බවත්, එය සිදු කර ගැනීමට හැකි වේ යැයි ලොකු විශ්වාසයක් පවතින බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය.

මුලින් වැඩක් ආරම්භ කළ යුතු බවත්, හොරගොඩ මාර්ගය ද යාමට නොහැකි තත්වයක පවතින බවත්, ගරු මිස්බාහ් මන්ත්‍රීතුමා පැවසූ එම පාරේ එක් නිවසක ඉස්සරහ පාරේ කොන්ක්‍රීට් ගල් ඇල්ලීමේදී පැත්තකින් නිවස ඉදිරිපිට පැත්තකින් වතුර බැස යාමට කාණුවක් සකසා ඇති බවත්, දමා වසා තිබූ බවත්, ඒ පිළිබඳව සොයා බලන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

11 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශන චක්‍රලේඛ අංක 2014/පුස්/ 02 හා අ (සංශෝධිත 2025) චක්‍රලේඛය අනුව ඔක්තෝම්බර් මාසයට යෙදෙන කියවීම් මාසයට සමගාමීව විශේෂ වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත.

ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව මඟින් 2026 වර්ෂයේ ජාතික කියවීම් මාසය නිමිති කර ගෙන සත්සියොත් සර 2026 සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා රුපියල් 358,150.00 ක වියදම් ඇසම්තමේන්තුවට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි. (ඇමුණුම i)

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

11 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචිවීමට හා කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචිවීමට ඉදිරිපත්ව ඇති ආයතන සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි. (ඇමුණුම xv)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

11 (iii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ සතිපොල අසල V හැඩ අංක 03 කඩකාමරය සඳහා 2026.08.12 වන දින කැඳවූ ලංසු විවෘත කළ අතර එහිදී වැඩිම ලංසුව ඉදිරිපත් කළ කඳන්හේනගේ දිලාන් රංජිත් අබේවංශ මයාගේ ලංසුව පිළිගන්නා ලදී.

සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් පළාත් පාලන ආයතන සතු නිශ්චල දේපල බදු දීමට අදාළව නිකුත් කර ඇති 01/2023 චක්‍රලේඛයේ සඳහන් පරිදි බදු දීමේ උපරිම කාලසීමාව වසර 30 ක් බැවින්, මෙම කඩකාමරය වසර 30 ක් සඳහා බදු දීමටත් එම ගිවිසුම් කොන්දේසිය අනුව ගිවිසුම්ගත වීම සුදුසු බවටත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

12 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

දිවුරුම්පිටිය සොහොන් භූමිය මායිම් පැහැදිලි කර භූමිය වටා වැටක් ඉදි කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

මෙහි කැළෑව වැවී ඇති නිසා අයථා කටයුතු සිදුවන බැවින් එය පිළිසකර කර වැටක් සකසා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

12 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

රන්පුරගම ඉන්ද්‍රාණි මහත්මියගේ නිවස අසල වලවල් සෑදී ජලය පිරී ඇති මාර්ගය 50 m පමණ කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් වී ඇති ආයතන සඳහා අනුමැතිය ලබාදීම සුදුසු කියා යෝජනා කළත් එම ලේඛනය ලැබී නොමැති බවත්, සහිකවරුන්ගන් කණ්ඩායමකට ලබාදී කණ්ඩායමකට ලබා නොදීමටත් හේතුව කුමක්ද කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එය අතපසු වීමක් බවත් එය මේ අවස්ථාවේ ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

13 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරු ලෙස සේවයේ යොදවා ගෙන ඇති W.L.A.S.K.විජේසුරිය මයා සමඟ එළඹී සේවා ගිවිසුම 2026.08.27 දිනෙන් අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය මත 2026.09.01 දින සිට මාස 03 ක කාලයක් සඳහා ගිවිසුම්ගතවීමටත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි අනු අංක 16 පරිදි වේතන ගෙවීමටත් සුදුසු බව 2026.08.11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී තීරණය කරන ලදී.

ඒ අනුව 2026.09.01 දින සිට නැවත මාස 03 ක කාලයක් සඳහා ඉහත නම් සඳහන්ගිවිසුම්ගත වීමටත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනු අංක 16 පරිදි වේතන ගෙවීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

13 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරු ලෙස සේවයේ යොදවාගෙන ඇති S. කුමාර මයා සමඟ එළඹී සේවා ගිවිසුම 2026.09.30 දිනෙන් අවසන් වේ.එබැවින් සේවා අවශ්‍යතාවය මත 2026.10.05 සිට නැවත මාස 03 ක කාලයක් සඳහා ඉහත නම් සඳහන් අය ගිවිසුම්ගත වීමට හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි 10/2025 අනු අංක 16 පරිදි වේතන ගෙවීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

13 (iii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව ඇති කළමනාකරණ සේවා නිලධාරීන් සංඛ්‍යාව 08 කි.එසේ වුවද, වරිපනම් ඒකක සංඛ්‍යාව පුළුල් වීම , නව සංවර්ධන ව්‍යාපෘති ඇති වීම හා පළාත් පාලන ආයතනයන්ගේ සේවාවන් පුළුල් වීම මත සේවක සංඛයාව ප්‍රමාණවත් නොවන බැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 19 (i) වගන්තිය ප්‍රකාරව මු.රෙ 71 අනුව කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 05 ක් ඇති කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජීර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙම යෝජනාව සභාව අනුමැතිය ලද පමණින් නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි බවත්, කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර සිදු කළ යුතු කාර්යක් බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

14 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

කිරිපෝරුව අමුකොටුව ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

මෙම ජල යෝජනා ක්‍රමය වසර 30 ක් පමණ පැරණි ජල යෝජනා ක්‍රමයක් බවත්, ග්‍රාමීය ජනතාවගේ පානීය ජල ගැටලුව සඳහා වසර 30 කට පෙර පැවැති රජයන් විසින් යෙදවූ ප්‍රතිපාදනවලින් සැකසූ බව දැන ගැනීමට ලැබුණු බවත්, එය මේවන විට එය අබලන් තත්වයේ පවතින බැවින් එය සංවර්ධය කර ජනතාවගේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීමට සකස් කර දෙන ලෙසත්, එහි ජලය නිවාස 20 කට පමණ ප්‍රයෝජනයට සුදුසු බවට එකල යෝජනා වී තිබුණ ද මේවන විට ජලය ලබාගනු ලබන්නේ නිවාස 15ක් පමණ බවත්, ඉතිරි නිවාස සඳහා ජලය ලබාගැනීමට සංවර්ධනය කරදෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා.

එම ජල යෝජනා ක්‍රමය ආරම්භ කරනු ලැබුවේ තම පියා ප්‍රාදේශිය සභාවේ සිටින කාලයේ බවත්, එයින් විශාල සේවයක් සිදුවන බවත්, අලුත්වැඩියා කිරීමක් මෙහි විශේෂයෙන් ම කළ යුතුව තිබෙන බවත්, එම අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය.

එහි පවතින ටැංකිය යටින් හිල් වී ජලය නොරැඳීම නිසා ජලය ලීක් වීමක් සිදුවන බැවින්, ජල ටැංකිය සංවර්ධනය කළ යුතුව පවතින බවත්, ටැංකියේ ජලය නොරැඳවීම නිසා අසල නිවාස වලට පමණක් ජලය ලැබෙන බවත් සෑම

නිවසකටම ජලය ලැබෙන පරිදි එම ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කරගත යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා පෙ.ව 10.06 ට සභා ගර්භයෙන් පිට විය.

15 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වැසිකිළි පද්ධතිය හා ගේට්ටුව අලුත්වැඩියා කිරීම කර්මාන්තය ඉටු කිරීම සඳහා 2026.03.10 දින සභා අනුමැතිය ලබා දී ඇත.එසේ වුවත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබාදෙන බවට දැනුම් දීම මත එම යෝජනාව සංශෝධනය කර ප්‍රාදේශිය සභා කාර්යාලයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කරන ලදී.අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් කිරීමේ දී මෙම ප්‍රාදේශිය සභාව මෙම වසරේ තොරා ගැනීමත් සිදු කර නොමැත.නගරයට පැමිණෙන ජනතාවට අවශ්‍ය වැසිකිළි පහසුකම් ලබාදීම සඳහා සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වැසිකිළිය අලුත් වැඩියා කිරීම අත්‍යවශ්‍ය වේ.ඒ සඳහා සකස් කරන ලද රු. 1,955,000.00 වටිනා ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් අනුමත සමිතියක් මඟින් ගිවිසුම්ගත වී එම කර්මාන්තය ඉටු කරවා ගැනීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

15 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ සංවර්ධන කටයුතු ප්‍රාදේශිය සභා ප්‍රතිපාදන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ අවස්ථා කිහිපයකදීම සංවර්ධනය කරන ලදී.
එසේ වුවත් තවත් ඉටු කළ යුතුව ඇති මහජන පුස්තකාලයේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට හා පිවිසුම් ගේට්ටුව සකස් කිරීමටත් වැසිකිළිය සඳහා පිවිසුම් ගේට්ටුව සකස් කිරීම සඳහා සකස් කරන ලද රුපියල් 822000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් අනුමත සමිතියක් සමඟ ගිවිසුම්ගත වී කර්මාන්තය ඉටු කරවා ගැනීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

මෙම සංවර්ධන යෝජනාව සඳහා මෙම වසරේ හතර පස් වතාවක්ම ප්‍රතිපාදන වෙන්කල බවත් මෙහි තවත් සෑදීමට තිබේද නැතිනම් මෙම යෝජනාවෙන් පසු හේ වැඩ කටයුතු නිමවනවා ද යන්න දැන ගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ පිළිබඳව විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස යෝජනා කරන ලදී.

මහ සභාව කාරක සභාවක් බවට යෝජනා කිරීම ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් කළ අතර ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා පෙ.ව 10.10 ට සභා ගර්භයෙන් පිට විය.

කාර්මික නිලධාරීතුමිය හදිසි අවශ්‍යතාවයක් සඳහා පොලිස් ස්ථානය වෙත ගොස් ඇති බැවින් ඇය පැමිණෙන තෙක් සභාවේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කර අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

(ඊ) 15 (iii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සෞඛ්‍ය කම්කරු තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ ගිවිසුමට අනුව මීගස්වල, ඇහැලියගොඩ ලිපිනයේ පදිංචි වයි.ඩී.සමීර සඳරුවන් සිරිපාල මයා 2019.07.12 සිට සේවයේ යොදවා ගෙන ඇති අතර 2019 දෙසැම්බර් මාසය දක්වා සේවය කරඉ ඇති අතර, අසනීප තත්ත්වයක් හේතුවෙන් වෛද්‍ය උපදෙස් පරිදි සේවයට වාර්තා කර නොමැත.එසේ වුවද මේවන විට ඔහු යහපත් සෞඛ්‍ය තත්වයේ පසුවන බැවින් නැවත සේවයේ යොදවා ගන්නා ලෙස ඔහු විසින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව 2026.08.05 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී පුහුණු කාල සීමාවකට යටත්ව සේවයේ යෙදවීමටත් සේවයේ කාර්යක්ෂමතාවය මත මහ සභා අනුමැතිය ලබා ගෙන තත්ත්කාර්ය පදනම මත වයි.ඩී.සමීර සඳරුවන් සිරිපාල මයා සෞඛ්‍ය කම්කරුවකු ලෙස බඳවා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.එබැවින් තත්ත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරුවකු ලෙස 2026.08.12 වන දින සිට බඳවා ගැනීමටත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි අනු අංක 16 පර්දි වේතන ගෙවීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15 (iv) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සබරගමු පළාත් ප්‍රධාන ලේකම්ගේ 1998.08.26 දිනැති මුදල් 11/98 චක්‍රලේඛ අනුව, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සේවය කරනු ලබන පහත් නම් සඳහන් ක්ෂේත්‍ර නිලධාරීන් සහ සෞඛ්‍ය අංශයේ කම්කරු සේවකයින් සඳහා නිල ඇදුම් ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

අනු අංක	නම	තනතුර
01	ටී.වී.නිශාන්ත රාමනායක මයා	කාර්මික නිලධාරී
02	ගයානි සොයිසා මිය	කාර්මික නිලධාරී
03	බී.ඒ.නදුන් ප්‍රියමාල මයා	ආදායම් පරීක්ෂක
04	ඩබ්ලිව්.එන්.ආර්.චන්ද්‍රසේන මිය	ආදායම් පරීක්ෂක
05	යූ.ජී.ඩී.ඩබ්ලිව්.උඩගෙදර මිය	ආදායම් පරීක්ෂක
06	එම්.චන්දිමා ප්‍රියදර්ශනී මිය	සෞඛ්‍ය කම්කරු
07	එච්. සමන්ත මයා	සෞඛ්‍ය කම්කරු
08	එච්. සරත් මයා	සෞඛ්‍ය කම්කරු
09	එන්. ජේමසිරි මයා	සෞඛ්‍ය කම්කරු
10	ජී. සුරිය කුමාරන් මයා	සෞඛ්‍ය කම්කරු
11	ඩබ්ලිව්.ප්‍රසන්න ජයලාල් මයා	සෞඛ්‍ය කම්කරු
12	එච්. සුමිත්‍රපාල මයා	සෞඛ්‍ය කම්කරු
13	ඒ.ඩී.ප්‍රදීප් රෝහණ මයා	සෞඛ්‍ය කම්කරු
14	එස්.සචලා ධනංජනී ආරියවංශ මිය	සෞඛ්‍ය කම්කරු
15	ටී.චන්ද්‍රලතා මිය.	සෞඛ්‍ය කම්කරු
16	එච්.ජී.ඩී.එම්.මුණසිංහ මයා.	සෞඛ්‍ය කම්කරු

17	එම්.ඩී.රත්නසේකර මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
18	ටී.පී.ගුණතිලක මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
19	යූ.ජී. නිරංජලා කරුණාතිලක මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
20	පී.එස්. සම්පත් ප්‍රේමජයන්ත මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
21	එච්.මිලින්ද රොෂාන් මධුෂංක මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
22	යූ.ජී.නලිනි රුදිගු මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
23	එම්.ජේ.පාතුමා සෆ්රිනා මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
24	ඩබ්ලිව්.ඒ.අයෝනා වික්‍රමආරච්චි මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
25	එම්.එම්තසඳමාලි මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
26	ඩී.ඒ.ශිරෝමි පුෂ්පිකා දිමියාව මිය	වැඩ ක්ෂේත්‍ර කම්කරු
27	ඊ.ඩී.වමින්ද මෙල්සිරි වික්‍රමසිංහ මයා	විදුලි කම්බිකරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පහත සඳහන් පරිදි ලබාදුන් ඇමුණුමේ සඳහන් නම් 16ට අමතරව අතපසු වූ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් පිරිසක් සිටින බවත් එම ලේඛනය මෙම අවස්ථාවේ තමන් අතට පත් වූ බැවන් එම නම් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15 (v) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 168(1) වගන්තිය මඟින් ලැබී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂය සඳහා පිළියෙල කර සම්මත කරනු ලැබූ අයවැය ලේඛනය මඟින් පහත සඳහන් වැය විෂයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවා පහත සඳහන් ආදායම් ශීර්ෂවල ලැබීම් ඇති බැවින් ඉහත කී පනතේ 168 (3) වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද පහතින් සඳහන් වන පරිපුරක අයවැය ලේඛනය සම්මත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අය ශීර්ෂය	අය විස්තරය	මුදල රු.	වැය ශීර්ෂය	වැය විස්තරය	මුදල රු.
	ප්‍රතිපූර්ණයෙන් වැඩිපුර ලැබුන වැටුප් 20%	8,986,084.00	102.11	සේවක ණය	14,637,406.00
1.63.1	ඇස්තමේන්තුව ඉක්මවා ලැබුනුමුද්දර ගාස්තු	10,000,000.00	109.1	කාර්යාල උපකරණ හා ලී බඩු	2,500,000.00
1.52	ඇස්තමේන්තුව ඉක්මවා ලැබුනු උසාවි දඩ	20,000,000.00	109.2	වාහන මිලදී ගැනීම	2,200,000.00
			204.1	වාහන අළුත්වැඩියාව	4,000,000.00
			309.9	කර්මාන්ත හා සභා දේපල සංවර්ධනය	6,493,678.00
			509.1	සභා දේපල සංවර්ධනය	3,655,000.00
			509.9	වීථි පහන්	500,000.00
			609.3	කාර්යාල උපකරණ හා ලී බඩු	5,000,000.00
	එකතුව	38,986,084.00		එකතුව	38,986,084.00

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පෙ.ව 10.18 ට සභාවට පැමිණෙන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අයවැය සැකසීමේදී 40% අඩුකර සැකසූ බවත්,20% බැගින් ප්‍රතිපූරණය කරන ලෙසට මධ්‍යම රජයෙන් පැවසුවත්, මෙම වර්ෂයේ එය සිදු කර නොමැති බවත්, මුල් 20%ක් පමණක් සිදු කර ඇති බවත්, එම නිසා එයින් රු.8,986,084.00 ක මුදලක් තිබෙන බවත්, ඇස්තමේන්තුව ඉක්මවා මුද්දර ගාස්තු ලෙස මිලියන 10 ක මුදලක් ලද බවත්, ඇස්තමේන්තුව ඉක්මවා උසාවි දඩ මුදල් ලෙස මිලියන 20 ක ප්‍රමාණයක් ලද බවත් ඒ අනුව රු.38,986,084.00 ක මුදලක් ලැබී ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

සේවක ණය ලෙස වැය ශීර්ෂයක් නොතිබූ බැවින් එම රු.14,637,406.00 ක මුදල මෙම අමතර මුදලින් පියවා ගත හැකි බවත්, කාර්යාල උපකරණ හා ලී බඩු සඳහා රු. 2,500,000.00 ක්ද, වාහන මිලදී ගැනීම සඳහා බලාපොරොත්තු වන බැවින් රු.2,200,000.00 ක මුදලක් ද, වාහන අළුත්වැඩියාව යටතේ ටිපර් රථය අලුත්වැඩියා කිරීමට හා ඉතිරි කටයුතු සිදු කිරීමට රු.4,000,000.00 ක මුදලක් ද, කර්මාන්ත හා සභා දේපල සංවර්ධනය සඳහා රු.6,493,678.00 ක මුදලක් ද, සභා දේපළ සංවර්ධනය සඳහා රු.3,655,000.00 ක මුදලක් ද, වීථි පහන් සඳහා රු.5,000,000.00 ක මුදලක් ද, අලුත්වැඩියා කරමින් පවතින ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ ලී බඩු අලුතින්ම ලබා ගැනීමට සිදුවන බැවින් කාර්යාල උපකරණ හා ලී බඩු සඳහා රු.5,000,000.00 ක මුදලක් ද, ඇතුළුව රු. 38,986,084.00 ක මුදලක් ලෙස පරිපූරක ඇස්තමේන්තුව සමන්විත වන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 10.20 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කාර්මික නිලධාරිතුමිය පැමිණි බැවින් ස්ථිර වූ 15(ii) යෝජනාවෙහි කඩින් කඩ අනුමත වූ ඇස්තමේන්තු පිළිබඳව කරුණු විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා යෝජනා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

15(ii) යෝජනාවට අදාළ වූ කරුණු සම්බන්ධව විෂය නිලධාරිතුමා, කාර්මික නිලධාරිතුමිය හා සභා ලේකම් විසින් පැහැදිලි කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.22 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 10.27 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.35 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.45 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ඊ) 15 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ සංවර්ධන කටයුතු ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ අවස්ථා කිහිපයකදිම සංවර්ධනය කරන ලදී.

එසේ වුවත් තවත් ඉටු කළ යුතුව ඇති මහජන පුස්තකාලයේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට හා පිවිසුම් ගේට්ටුව සකස් කිරීමටත් වැසිකිළිය සඳහා පිවිසුම් ගේට්ටුව සකස් කිරීම සඳහා සකස් කරන ලද රුපියල් 822000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් අනුමත සමිතියක් සමඟ ගිවිසුම්ගත වී කර්මාන්තය ඉටු කරවා ගැනීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව පහත සඳහන් පරිදි සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලදී.

සංශෝධිත යෝජනාව:-

ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ සංවර්ධන කටයුතු ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ අවස්ථා කිහිපයකදිම සංවර්ධනය කරන ලදී.

එසේ වුවත් තවත් ඉටු කළ යුතුව ඇති මහජන පුස්තකාලයේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට හා පිවිසුම් ගේට්ටුව සකස් කිරීමටත් වැසිකිළිය සඳහා පිවිසුම් ගේට්ටුව සකස් කිරීම සඳහා සකස් කරන ලද රුපියල් 1,576,000.00 ක සංශෝධන ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් මඟින් මිල ගණන් කැඳවා කර්මාන්තය ඉටු කරවා ගැනීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

කාර්මික නිලධාරීතුමිය ලක්ෂ දහහතරක් බව කාරක සභා අවස්ථාවේ පැවසූ බවත්, එය රුපියල් 1,576,000.00 ක් වන්නේ කෙසේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අවිනිශ්චිත මුදලක් ලෙස 10% ක් ඇතුළත් කළ යුතු බවත්, එම 10% ත් සමඟ රුපියල් 1,576,000.00 ක මුදලක් ඇතුළත් විය යුතු බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මිල ගණන් කැඳවා කර්මාතය සිදු කිරීම ද වාසි සහගත, ටෙන්ඩර් කැඳවා කර්මාතය සිදු කිරීමද සභාවට වාසි සහගත යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසිමක් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මිල ගණන් කැඳවා සිදු කළ හොත් 5% ක් සමිතියට නොයන බවත්, ටෙන්ඩර් කැඳ වීමෙදී මුළු මුදලම එම සමාගමට යන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ shoping method යනුවෙන් සඳහන්ව ඇති බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

ඇස්තමේන්තු සැකසීමේ දී එම අවිනිශ්චිත මුදල ඇතුළත් නොවන ලෙස ද ඇස්තමේන්තු සකස් කර ඇත්තේ, නැත්නම් අවිනිශ්චිත මුදල ඇස්තමේන්තුවට අමතරවද ඇතුළත් කරන්නේ ද යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රශ්න කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රශ්න කරනු ලබන්නේ, කාර්මික නිලධාරීතුමිය ප්‍රකාශ කළ ලක්ෂ 14 ක මුදලට අවිනිශ්චිත මුදල ඇතුළත් නොකර ද ප්‍රකාශ කළේ යනුවෙන් ඇය විමසන කාරණය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් පැහැදිලි කරන්නට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම අවිනිශ්චිත මුදල ඇතුලත් නොකර රු. 14 ලක්ෂයක් ලෙස ප්‍රකාශ කළ බවත්, මෙම 10% මුදල ඇතුළත් කළ යුතු බවත්, සමරවිට මෙම මුදල ඉතිරි වීමට හෝ ඉතිරි නොවීමට පුලුවන් බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15 (vi) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පළාත් සභා ප්‍රතිපාදන හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට නියමිත පහත වැඩ විෂයන් සඳහා 2026.07.09 දින පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීම් පළ කළ අතර 2026.07.24 දින ලංසු විවෘත කිරීම සිදු කරන ලදී.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ලංසු කරු	ලංසු මුදල
01	මෝරගල හොරගොඩ පාර අසල පාලම ඉදිකිරීම	ධර්මදාස කන්ස්ට්‍රක්ස්ට්‍රක්ෂන්	11601986.10
		ගීෂාන් බිල්ඩර්ස්	9,637,963.03
		සදිල්මා කන්ස්ට්‍රක්ෂන්	8,604,699.15
02	සදර්ලැන්ඩ් වත්ත අශෝක රංජන් මහතාගේ නිවස අසල සිට දුෂ්කර කොටස් සංවර්ධනය කිරීම	ආසිරි කන්ස්ට්‍රක්ෂන්	2,782,406.70
03	කීනගහවිල ආයුර්වේදයේ අත්‍යවශ්‍ය කොටස් වැඩි දියුණු කිරීම	රිලයන්ට් කන්ස්ට්‍රක්ෂන්	4,163,177.50
04	බෙරුවාන කසළ කළමණාකරන අංගනය පුළුල් කිරීම	සදිල්මා කන්ස්ට්‍රක්ෂන්	6,464,845.00
		රිලයන්ට් කන්ස්ට්‍රක්ෂන්	8,124,950.00
		ප්‍රසාත් කන්ස්ට්‍රක්ෂන්	5,700,000.00

එමෙන් ම, පහත වැඩ විෂයන් සඳහා 2026.07.16 දින පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීම් පළ කළ අතර 2026.07.31 දින ලංසු විවෘත කිරීම සිදු කරන ලදී.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ලංසු කරු	ලංසු මුදල
01	ඇහැලියගොඩ සති පොළ භූමියේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදි කිරීම	G.S.N කන්ස්ට්‍රක්ෂන්	15,590,475.76
02	ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ ගෙබිම ටයිල් කිරීම හා සිවිලිම සැකසීම	ගීෂාන් බිල්ඩර්ස්	2,073,140.78
		බියුටි ලංකා කන්ස්ට්‍රක්ෂන්	2,249,976.00

මෙම කර්මාන්ත වලට අදාලව ඉදිරිපත් කර තිබූ සියළුම ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කිරීමෙන් අනතුරුව ඒ ඒ ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ තිරණ පහත පරිදි වේ.

- මෝරගල හොරගොඩ පාර අසල පාලම ඉදිකිරීම - අවම ලංසුව වන 8,604,699.15 ඉදිරිපත් කර ඇති සදිල්මා කන්ස්ට්‍රක්ෂන් ආයතනයට පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇත.

- සදර්ලෑන්ඩ් වත්ත අශෝක රංජන් මහතාගේ නිවස අසල සිට දුෂ්කර කොටස් සංවර්ධනය කිරීම - මෙම කර්මාන්තයට අදාලව ලංසු ඉදිරිපත් කර ඇත්තේ ආසිරි කන්ස්ට්‍රක්ෂන් ආයතනය පමණි..එම ලංසු මුදල රු 2,782,706.70 කි .එසේ වුවත් ඉංජිනේරු ඇස්තමේන්තු වැඩ වටිනාක වන්නේ 2,251,651.47 කි.එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තු වැඩ වටිනාකට ව්‍යාපෘතිය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වන්නේදැයි විමසා කොන්ත්‍රාත්තුව පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇත

- කීනගහවිල ආයුර්වේදයේ අත්‍යවශ්‍ය කොටස් වැඩි දියුණු කිරීම - මෙම කර්මාන්තයට අදාලව ලංසු ඉදිරිපත් කර ඇත්තේ රිලයන්ට් කන්ස්ට්‍රක්ෂන් ආයතනය පමණි..එම ලංසු මුදල රු 4,163,177.50 කි .එසේ වුවත් ඉංජිනේරු ඇස්තමේන්තු වැඩ වටිනාක වන්නේ 3,388,384.33 කි.එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තු වැඩ වටිනාකට ව්‍යාපෘතිය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වන්නේදැයි විමසා කොන්ත්‍රාත්තුව පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇත.

- බෙරුවාන කසළ කළමණාකරන අංගනය පුළුල් කිරීම - අවම ලංසුව වන 5,700,000.00ඉදිරිපත් කර ඇති ප්‍රසාත් කන්ස්ට්‍රක්ෂන් ආයතනයට පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇත.

- ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ ගෙබිම ටයිල් කිරීම හා සිවිලිම සැකසීම - අවම ලංසුව වන 2,073,141.08 ඉදිරිපත් කර ඇති ගීෂාන් බිල්ඩර්ස් ආයතනයට පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇත.

ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන කමිටුවේ එකඟතාවය ලබා දෙන ලදී.එම එකඟතාවය ලබා දී ඇති ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීමත් එම කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් ගත වී කර්මාන්ත ඉටු කරවා ගැනීමටත් මෙම සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

2026.07.24 ව්‍යාපෘති හතරක ලංසු විවෘත කර ඇති බවත්, එලෙස ලංසු විවෘත කර ඇති ව්‍යාපෘති 04න් මේවන විට ආරම්භ කර ඇති ව්‍යාපෘති මොනවාද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෝරගල හොරගොඩ පාර, සදර්ලෑන්ඩ්වත්ත, කීනගහවිල ආයුර්වේදය හා බෙරුවාන කසළ කළමණාකරන අංගනය යන ව්‍යාපෘති බවත්, මෙම ව්‍යාපෘති 4 ම තාම වැඩ ආරම්භ කර නොමැති බවත්, මේ සඳහා සභාවේ අවසරය ලබා ගැනීම කළ යුතු බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.විසින් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.වමිලා සූරියආරච්චි මැතිණිය පෙ.ව 11.02 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

2026.07.31 ගෘහස්ථ ක්‍රීඩාංගනය වෙනුවෙන් හදිසියේ විශේෂ මහ සභාවක් මගින් යෝජනා සම්මත කර ගත් බවත් 2026.07.31 දින ඇහැලියගොඩ මහජන පුස්තකාලයට හා ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීමට ලංසු විවෘත කළ බැවින් එම ව්‍යාපෘති දෙකෙන් මේවන විට ආරම්භකර ඇත්තේ කුමන ව්‍යාපෘතියද කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.03 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ සිවිලිම මේවන විට සකස් කරමින් පවතින බවත්, ඇහැලියගොඩ සතිපොල භූමියේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම තවම නොපැමිණි බවත්, මේ වන විට ලංසු විවෘත කර මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, සබාව විසින් තීරණය කළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත යැවීම සිදු කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.04 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලැබී ඇත්තේ ගරු සභාපතිතුමා සඳහන් කළ ව්‍යාපෘති 05 සඳහා ද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ සතිපොළ භූමියේ ගෘහස්ථ ක්‍රීඩාංගනය හැර අනෙකුත් ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කළ හැකි බවත්,කීනගහවිල ආයුර්වේදයේ හා සදර්ලන්ඩ්වත්ත ව්‍යාපෘතියේ යම් ප්‍රශ්නයක් ඇති වී ඇති බවත්, එහි ලංසුකරු විසින් රු. 4,163,177.50 ක මුදලක් නියම කර ඇති බවත්, නමුත් ඉන්ජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් වන්නේ, වැඩ වටිනාකමට වඩා කොන්ත්‍රාත්කරු වටිනාකම යොදා ඇති බවත්, එවිට කොන්ත්‍රාත්කරු කැමති නම් ඔහුගේ වටිනාකම වැඩි නොකරන බවත්, ඉන්ජිනේරු ඇස්තමේන්තුවේ මුදල අනුව වැඩ කළ හැකි බවත්, නමුත් කොන්ත්‍රාත්කරු කැමති වී නැති බවත්, කොන්ත්‍රාත්කරු කැමතිනම් පමණක් එවිට එම කාර්ය සිදු කළ හැක්කේ ඉංජිනේරු ඇස්තමේන්තු මුදලට බවත් කොන්ත්‍රාත්කරු ඉංජිනේරු ඇස්තමේන්තු මුදලට සිදු කිරීමට එකඟතාවය ලබාදෙන්නේ නම් එම ව්‍යාපෘති සිදු කළ හැකි බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය පෙ.ව 11.05 ට නැවත සභාවට පැමිණෙන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එවිට නැවත ටෙන්ඩර් කැඳවීහම සිදු කරනවා ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.07 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එක් ව්‍යාපෘතියක් සඳහා එකඟතාවය පළ කළ බවත්, කීනගහවිල ව්‍යාපෘතිය සඳහා සිදුව ඇත්තේ අපගේ තාක්ෂණික නිලධාරීන්ගේ එක් අයිතමයක වරදක් බවත් අපගේ තාක්ෂණික නිලධාරීන්ට හා ඉංජිනේරුවරයාටද එය නොපෙනුන බවත් එය දුටු කොන්ත්‍රාත්කරු ඒ සඳහා අකමැත්ත පළ කර ඇති බවත්, එම නිසා නැවත වරක් කීනගහවිල ආයුර්වේදය සඳහා ටෙන්ඩර් කැඳවීමට සිදුවිය හැකි බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

ඇහැලියගොඩ සතිපොල ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ලබා ගෙන ඇති G.S.N කන්ස්ට්‍රක්ෂන් යනු කොහේ එකක්ද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
තමන් දන්නා ලෙස G.S.N කන්ස්ට්‍රක්ෂන් හා ගිෂාන් කන්ස්ට්‍රක්ෂන් යන ආයතන දෙකම එකකට එකක් සම්බන්ධ ආයතන දෙකක් බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

මෙම යෝජනා 05 සඳහා තාක්ෂණික කමිටු තීරණ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීම යනුවෙන් 2026.08.20 වෙනිදා මුදල් කාරක සභාවේ වටිස්ඇප් සමුහයට විෂය නිලධාරී ජී.එස්.එන්.ලක්මාල් මහතා විසින් පෙ.ව.8.40 ට අපගේ කෙටි පණිවිඩයක් යොමු කර තිබෙන බවත්, නමුත් මෙය පවත්වනු ලබන්නේ පෙ.ව.9.30 ට බවත්, එදින හදිසියේ කැඳවීම් කරනු ලබුවේ ඇයි ද කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.

2026 .08 වෙනි මස එම ලිපියේ දිනයක් නොමැති බවත් ගරු සභාපතිතුමා අත්සන් කර නොමැති බවත්, නමුත් විෂය නිලධාරී විසින් එය වටිස්ඇප් සමුහයට යොමු කර ඇති බවත්, මෙම මුදල් කමිටු වටිස්ඇප් සමුහයේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා, තමන්ද ඊට අමතරව වාතුල්‍යා දෙනිපිටිය,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව හා සමීර දෙල්ගමුව කියා පුද්ගලයෙක් ද සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ඇහැලියගොඩ සතිපොල භූමියේ එක් ගොඩනැගිල්ලක් ගෘහස්ථ ක්‍රීඩාපිටියක් ලෙස නවීකරණය කිරීමේ සමාරම්භය රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය ජනක සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2026.08.14 ඇහැලියගොඩ පොළ භූමියේ සතිපොළ පරිශ්‍රේයදී සිදුවිය කියා සමාජ මාධ්‍යය හි තමන් දුටු බවත්, මෙම කාර්ය දැනටමත් සිදු වනවා යැයි තම ගමේ මිනිසුන් සිතන් සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
එම කාර්යය සිදුවන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.(සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ටී.සී.අතුරලිය මැතිතුමා.

පොළ භූමියේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීමට තාක්ෂණික ඇගයීම තවම ලැබී නොමැති බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කළ බවත්, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව නොමැතිව මුල් ගල තියා වැඩ ආරම්භ කළේ කෙසේ ද යන්නත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මුල් ගල නොතිබූ බවත්, දැන්වීම නිරාවරණය කිරීම පමණක් සිදු කළ බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ටී.සී.අතුරලිය මැතිතුමා.

මෙම ව්‍යාපෘතියට තාක්ෂණික කමිටුවේ අනුමැතිය නොලැබුණ හොත් එම බෝර්ඩ් එක ගලවා දමනවා ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ටී.සී.අතුරලිය මැතිතුමා විමසීම් කරන ලදී. (සෝෂාව)

මීට පෙර ආණ්ඩුවල මෙම තාක්ෂණික ඇගයීම නිවැරදිව සිදු කර නොමැති බව කියන පදනම මත විශාල විවේචන තිබූ බවත්, මේවන විට තාක්ෂණික ඇගයීමක් නොමැතිව බෝර්ඩ් පවා සවිකර ඇති බවත්, එම ගැටළුව ඔබලාගේ ප්‍රතිපත්තිවලට ගැටළුවක් බවත් එම කාර්යය පිළිබඳව නැවත මෙනෙහි කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ .ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
15(vi) යෝජනාව පිළිබඳව කරුණු විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා යෝජනා කරන ලදී.
ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

15(vi) යෝජනාවට අදාළ වූ කරුණු සම්බන්ධව වට්ස්ඇප් සමූහය වෙත යොමු කළ ලිපිය සම්බන්ධව විෂය නිලධාරීතුමාගෙන් කරුණු පැහැදිලි කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.10 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

15 (vii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ඇහැලියගොඩ පනාවල කන්ද උඩ හෙට්ටිගේවත්ත ලිපිනයේ මාස්ටර් ලැන්ඩ්ස් ටු පුද්ගලික සමාගම විසින් කළුගල් කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යනු ලබයි.එහි කළුගල් ප්‍රවාහන කටයුතු සඳහා සහ ගණුදෙනුකරුවන්ගේ වාහන ගමනාගමනය සඳහා ඇහැලියගොඩ පනාවල ඉලුක්පිටිය කන්ද මාර්ගයේ ප්‍රථම මීටර් 200 ක දුර භාවිතා කිරීම වෙනුවෙන් මෙම සභාව සමග ගිවිසගෙන ඇති පස් අවුරුදු ගිවිසුම 2026/09/28 දිනෙන් අවසන් වේ.අදාළ ආයතනය විසින් නැවත ගිවිසුම අලුත්කරවා ගැනීමට ඉල්ලීම් කරන බැවින් උක්ත මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් මාසිකව රු 8,000.00 බැගින් සභාව වෙත අයකර ගැනීමටත්,වසර තුනක් සඳහා ඇපකැන්පත් මුදල රු 200,000.00 ක මුදලක් සභාවේ තැන්පත් කිරීමටත්, 2026/09/29 දින සිට ඉහත ආයතනය සමග නව ගිවිසුමකට එළඹීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

දැනට මාසිකව කොපමණ මුදලක් අයකරනවාද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ගරු සභාපතිතුමාගෙන් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

දැනට රු.5,000.00 ක මුදලක් අයකරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එවිට රු.8000.00 අය වන විට ගල් කියුබ් එකක මිල වැඩිවනවාද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඔවුන් කොහොමත් මිල වැඩි කරන බවත්, වසර පහකට පසුව මෙම ගිවිසුම අලුත් කරන බැවින් අපට ද වැඩි කිරීමට සිදුවන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා පෙ.ව 11.12 ට සභා ගර්භයෙන් පිට විය.

16 (i) ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

පැල්පිටිය කණුකැටිය මාර්ගයේ දෙවන පටුමග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පැල්පිටිය ජනතාව විසින් තමන්ව තෝරාගෙන ඇති බවත් නමුත් ඒ සඳහා මැදිහත් වී තමන්ගේ රාජකාරී කටයුතු පහසු කිරීම පිළිබඳව හා දැඩි රාජකාරී කටයුතු අතරතුර ඒ සඳහා මැදිහත් වීම පිළිබඳව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා හට විශේෂ ස්තුතියක් සිදු කරන බවත්, පැල්පිටිය කණුකැටිය මාර්ගයේ දෙවන පටුමග යනු කුමක්ද කියා දැන ගැනීමට කැමති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 11.12 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මීට පෙර සභා වාරයකදී අනුමත කරල ලද ගැසට් පත්‍රයේ සඳහන් වන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මාර්ග එක්දහස් අටසිය ගණනකි තිබෙන බවත්, එයින් මාර්ග පන්සියයක් පළමුව ගැසට් කළ බවත්, ඉතිරි මාර්ග ගැසට් කිරීමට ඉංග්‍රිසි හා දෙමළ පරිවර්ථන කටයුතු සඳහා යොමු කර ඇති බවත්, එහිදි මාර්ග සඳහා කුමන නම භාවිතා කළත්, එම කාර්ය සැලසුම් කළ නිලධාරීන් නිශ්චිත නමක් යොදමින් ඒ කාර්ය සිදු කර ඇති බවත්, පැලිපිටිය කණුකැටිය මාර්ගයෙහි නවරත්න මහතාගේ නිවස අසලින් වැටී ඇති මාර්ගයෙහි දෙවන මාර්ගය මෙම දෙවන පටුමග ලෙස සටහන් කර ඇති බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 11.13 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර සකාෘතා වාර්තාවක් ගන්නා බවත්, එම ස්ථානයට ගොස් තාක්ෂණ ඇගයීමක් කර එම කටයුතු සිදු කරන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එය ඉතා වැදගත් බවත්, ව්‍යාපෘතියක් හදුනා ගැනීමේ දී මාර්ගය පිළිබඳ හදුනා ගැනීමට අවශ්‍ය දත්ත ව්‍යාපෘතියට වාසිදායක බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

වරිපනම් බල ප්‍රදේශයේ තිබෙන වරිපනම් ගෙවන ජනතාවක් සිටින පාරක් බවත්, ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 250 ක් විහිදෙන මාර්ගයක් බවත්, උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

දෙවන පටුමගෙහි ප්‍රශ්නයට පිළිතුරු ලැබුණු බවත්, පළමු පටුමගෙහි තිබූ ගැටළුව විසඳා ගත්තාද යන්න පිළිබඳව විමසූ අතර, එම ගැටලුව විසඳා දෙන ලෙසට අධිකරණයෙන් වසර තුනක කාලයක් ලබා දී ඇති බවත්, ඒ සඳහා මැදිහත් වීමක් මේවන විට සිදු වනවා ද, එහි වත්මන් ප්‍රගතිය දැන ගැනීමට ද කැමති බවත්, එය කණුකැටිය පළමු පටුමග බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව තමාට අවබෝධයක් නොමැති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ මීළඟ සභාව සඳහා ඒ සම්බන්ධව යොමු කරන ලෙසත්, එහිදි විධිමත් තොරතුරක් ලබා දීමට කටයුතු කරන බවත්, උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ ඔක්තෝම්බර් මස සභා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට තමා යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.13 ට සභා ගර්භයෙන් පිට විය.

17 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රදේශිය සභාව යටතේ පාලනය වන දිවුරුම්පිටිය නිල්දියවර පානීය ජල ව්‍යාපෘතියෙන්, 2026.07.27 දිනැතිව නව ජල සබඳතාවක් ඉල්ලා සිටි නො.68, දිවුරුම්පිටිය, ගැටහැත්ත ලිපිනයේ පදිංචි බී.එම්.ඥානවතී මිය විසින් ඒ සඳහා 2026.07.28 දින ලදුපත් අංක 2026316 - 4339 යටතේ රු.1000.00 ක ඇප තැන්පත් මුදලක් හා රු.10,000.00 ක නව ජල සබඳතා ගාස්තු ලෙසින් රු.11,000.00 ක මුදලක් මෙම සභාවට ගෙවීම් ලෙස සිදු කර ඇත.නමුත් ඇය විසින් 2026.08.10 දිනැති ලිපිය මඟින් මෙම ජල සබඳතාවය අනවශ්‍ය බවට කරන ලද ඉල්ලීම පරිදි 2026.08.24 දින රැස්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුවේ දී ඇය වෙත රු.11,000.00 ක මුදල ආපසු ගෙවීමට තිරණය කරන ලදී.ඒ අනුව රු.11,000.00 ක මුදල නො.68, දිවුරුම්පිටිය, ගැටහැත්ත ලිපිනයේ පදිංචි බී.එම්.ඥානවතී මිය වෙත ආපසු ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා පෙ.ව 11.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.18 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ සඳහා කිසිඳු ගැටළුවක් නොමැති බවත් ඒ සඳහා එකඟ වන බවත්, අපිට පූර්වාදර්ශයක් තිබෙන බවත් ප්‍රතිපත්තිමය වශයෙන් ඉදිරියට හාම අවශ්‍ය බවත්, මුදල් ලබා ගෙන ලදුපතක් නිකුත් කළ විට, ප්‍රතිපත්තිමය

තීරණයක් ගැනීමේ දී මෙහි දින ගණන තීරණය කිරීමට අවශ්‍ය වන බවත්, මෙම සබඳතාවය අවශ්‍ය නොවන බව පවසා ආපසු මුදල් ලබාදෙන්න කියා මාස දෙකකට පසු ඉල්ලුවහොත් ලබා දෙනවාද නැද්ද කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ගරු සභාපතිතුමාගෙන් විමසා සිටින ලදී.

මෙම තීන්දුවත් සමඟ ප්‍රතිපත්තියකට යා යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සභාව වෙත ඉල්ලීමක් කර තබු බවත්, සභාවේ නිලධාරීන් එම ස්ථානයට ගොස් ජල සැපයුම ලබා දීමට ගිය විට, එම ස්ථානය කොන්ක්‍රීට් දමා ඇති බැවින් ජල නළ මාර්ගය සොයා ගත නොහැකි වූ බවත්, එම කොන්ක්‍රීට් කඩා එය සිදු කරනවාට වඩා ඒ අසන්නයෙන් ජල සම්පාදන නළ මාර්ගයද ගමන් ගන්නා බැවින්, එයින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

සිදු වී ඇති කාරණාව පැහැදිලි බවත්, සභාවට කුමන ආකාරයට ගෙන ආවත් යෝජනාව මේ ආකාරයට පැමිණ ඇති බවත් තමන් විසින් සිදුකරන කාරණයද සලකා බලා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නා ලෙසත්, මුදල් කමිටු අනුමැතියෙන් පසු රිසිට් පත්‍රයක් නිකුත් කළහොත් නැවත මුදල් ලබාදිය හැකි බවත් ඒ කුමන කාලයක් සඳහා ද යන්නත් පිළිබඳව විමසා සිටි අතර, මෙම යෝජනාව තමන්ට ගැටළුවක් බවත් මීළඟට ඥානවතී වෙනුවට සුමනවතී ඇවිත් ඉල්ලා සිටියහොත් එය ද ලබාදිය නොහැකි යැයි පවසා සිටියහොත් ඇයි ද සුමනවතීට ලබා නොදෙන්නේ කියා ප්‍රශ්නයක් තමාට මතු කිරීමට අවස්ථාව තිබිය යුතු බවත්, අප ලබාදෙන්නේ කෙලෙසද යන්න පිළිබඳව ගැටළුවක් මතුවන බවත් එම නිසා තමන්ට මෙම යෝජනාව සඳහා එකඟතාවය ලබා දිය නොහැකි බැවින් මෙම යෝජනාවට විරුද්ධ වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

විරුද්ධ වන හේතුව නිශ්චිතව පැහැදිලි කරන ලෙසට ගරු සභාපතිතුමන් විසින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ගෙන් විමසා සිටින ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙහිදී බී.එම්.ඥානවතී මහත්මිය විසින් 2026.07.28 වන දින රු.11,000.00 මුදලක් සභාවේ තැන්පත් කර ඇති බවත්, 2026.08.10 වන දින එම ජල සබඳතාවය අවශ්‍ය නොවන බව පවසා ඇති බවත්, මුදල් කමිටුවෙන් සබඳතාවය අවශ්‍ය නොවන්නේ නම් රු.11,000.00 ක මුදල ආපසු ගෙවීමට තීරණය කර ඇති බවත්, තමන් අසා සිටින්නේ මෙහිදී නම,දිනය,මුදල වෙනස් වුණ දිනයක මෙම තීරණය ම ලබාගන්නවා ද යන්න පිළිබඳව බවත් එ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
17 (i) යෝජනාව අදාළව කරුණු විමසීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා යෝජනා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.23 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා පෙ.ව 11.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.25 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.26 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා පෙ.ව 11.26 ට සභා ගර්භයෙන් පිට විය

17 (i) යෝජනාවට අදාළ වූ කරුණු සහා ලේකම් විසින් කරුණු පැහැදිලි කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා පෙ.ව 11.28 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

17 (i) අනුව කාරක සභාවේදී පැහැදිලි කරන ලද්දේ, සභා ලේකම් විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත්තේ ,ජල සබඳතා වෙනුවෙන් අය කරනු ලබන ජල ගාස්තුව මෙතෙක් කාලයක් තුළ සිදු කරනු ලැබුවේ එම මුදල් කෙලින්ම ආදායම් ගිණුමට බැර කිරීමට බවත්, නමුත් මෙම සිදුවීමෙන් පසුව සභා ලේකම් විසින් උපදෙස් ලබාදී තිබෙන්නේ එම මුදල් තැන්පතු ලෙස තබාගෙන සබඳතාවය ලබාදුන් පසු එය ආදායම් ගිණුමට බැර කිරීමට උපදෙස් ලබා දී ඇති බව ද සභා ලේකම් විසින් සමඟ සාකච්ඡාවෙන් පසු තමන්ට එය අවබෝධ වූ බව හා එසේ උපදෙස් ලබාදීම ප්‍රමාණවත් බවද මෙය සභාවට ඉදිරිපත් කර නැවත කියවීම අවශ්‍ය නොවන බවද එම නිසා මෙම යෝජනාව ගැටළුවක් නොවන බවත්, මෙය පළමු හා අවසන් අවස්ථාව වනු ඇති බවට තමන් බලාපොරොත්තු වන බවත්, මෙම යෝජනාවට තමාන් මුලින් විරෝධය ප්‍රකාශ කළ ද කරුණු විමසා අවබෝධ කර ගැනීමේ පසු යෝජනාව සඳහා එකඟතාවය ප්‍රකාශ කරන වන බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

රාජ්‍ය පළාත් රාජ්‍ය කළමණාකරණ සේවා නිලධාරී සංගමයේ 2026 වාර්ෂික සම්මේලනය මෙවර 2026.10.03 දින වවුනියාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.ඊට සහභාගීවීම සඳහා එම සංගමයේ සමාජික කළමනාකරණ සේවා නිලධාරීන්ට යාමට සහ ඒමට දුම්රිය බලපත්‍රයක් හිමි අතර, එම දුම්රිය බලපත්‍රයේ වටිනාකම හා සමාන මුදලක් ලබාගෙන දුම්රිය වෙනුවට බස් රථ මඟින් සම්මේලනය පැවැත්වෙන ස්ථානයට යෑමට හා ඒමට විශේෂ අනුමැතියක් ගරු ආණ්ඩුකාරතුමිය මඟින් එම සංගමය ලබාගෙන ඇත.එක් නිලධාරියෙකුට හිමි දුම්රිය බලපත්‍ර ගාස්තුව රුපියල් 7,200.00 ක් වන අතර අපප ආයතනයේ නිලධාරීන් 10 දෙනා සඳහා වන මුළු ගාස්තුව රුපියල් 72,000.00 කි.සංගමයේ සාමාජික, කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ඉල්ලීම අනුව මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජීනේන්ද්‍රානි මැතිනිය පෙ.ව 11.29 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මේ සඳහා සහභාගීවන නිලධාරීන් 10දෙනා නම්ක ර ඇත්ද යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කළමනාකරණ සේවා නිලධාරීන් ඒ සඳහා සහභාගී වන බවත්, එය වෘත්තීය අයිතිවාසිකමක් බවත් ඔවුන් නම්කර ඇති බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

17 (iii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සහ ඵලදායිතා සංකල්පය පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සඳහා විශේෂ අධ්‍යන චාරිකාවක් සංවිධානය කිරීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා වන දළ ඇස්තමේන්තුව රුපියල් 250,000.00 කි.කාර්ය මණ්ඩලය 64 ක් සහ ගරු මන්ත්‍රී මණ්ඩලය 36 ක් වශයෙන් සහභාගීවන පිරිස 100 කි.යෝජිත අධ්‍යන ස්ථානය ගාල්ල දිසිත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය වේ.මෙම දළ ඇස්තමේන්තුව හා යෝජනාව මුදල් හා පුනිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර එකඟතාව (2026.08.24) ලැබී ඇත.මෙම අධ්‍යන චාරිකාව ක්‍රියාත්මක කිරීමට ඒ සඳහා රුපියල් 250,000.00 ක් සහා අරමුදලින් වැය දැරීමටත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජීර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා පෙ.ව 11.31 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

මෙම චාරිකාව සඳහා තව මුදලක් එකතු කර ඉදිරි දින දෙකක් හෝ ප්‍රාදේශිය සභා කටයුතු පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන පුහුණු වැඩසටහනක් ලබාදෙනවා නම් ඉතාමත් වටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එතුමාගේ යෝජනාව ඉතා වැදගත් බවත් ඒ සඳහා ඔක්තෝම්බර් මාසයේදී ලංකාවෙම පිළිගත් ප්‍රසිද්ධ දේශකතුමන් කෙනෙක් ගෙන්වාගෙන විශේෂ පුහුණු වැඩසටහනක් සිදු කිරීමට කටයුතු යොදා ඇති බවත්, මෙය නිලධාරී මණ්ඩලය සහ මන්ත්‍රීතුමන්ලා/ මන්ත්‍රිවරියන් එක්ව ආයතනයේ අභිප්‍රේරණය සඳහා සිදු කරන වැඩසටහනක් බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.
ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.45 ට සභා ගර්භයෙන් පිට විය.

17 (iv) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

2026 පළාත් පාලන සතිය සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක Pl/T/3 ප. පා. සතිය 2026 දරන 2026.08.20 දිනැති ලිපිය අනුව 2026.09.14 සිට 2026.09.19 දක්වා පළාත් පාලන සතිය සිදු කිරීමට නියමිතය.ඒ අනුව ,

- 2026.09.14 - සමාරම්භක උත්සවය, ජංගම සේවා හා ආදායම් ප්‍රවර්ධන දිනය
- 2026.09.15 - මහජන උපයෝගිතා දිනය
  ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ජාත්‍යන්තර දිනය
- 2026.09.16 - පරිසර හා රුක්රෝපණ දිනය
  ඕසෝන් ස්ථරය සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර දිනය
- 2026.09.17 - සෞඛ්‍ය සහ සනීපාරක්ෂක දිනය
  රෝගී සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර දිනය
- 2026.09.18 - සාහිත්‍ය, අධ්‍යාපන, පුස්තකාල, සහ ක්‍රීඩා දිනය
- 2026.09.19 - සහතික පත්‍ර ප්‍රධානය සහ සමාප්තිය

වශයෙන් දිනයන් නම් කර ඇත.ඒ අනුව පළාත් පාලන සතියට සමගාමීව ඉහත දිනයන්හි සිදු කිරීමට නියමිත වැඩසටහන් සඳහා රුපියල් 371,000.00 ක වියදම් ඇස්තමේන්තුවට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි. (ඇමුණුම xvi)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.45 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

2026.09.18 දින සාහිත්‍ය, අධ්‍යාපන, පුස්තකාල සහ ක්‍රීඩා දිනය වෙනුවෙන් පිරිමි ක්‍රිකට් තරඟයක් පැවැත්වීමට යෝජනා කරන බවත්, කාන්තාවන් වෙනුවෙන් වොලිබෝල්, නෙට්බෝල් හෝ කාන්තා ක්‍රිකට් තරඟයක් සිදු කරන ලෙසත් ප්‍රාදේශිය සංවිධානය කිරීම සුදුසු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සඳහා මූලිකත්වය ගැනීමට කමිටුවක් පත්කිරීම සුදුසු බවත්, ක්‍රීඩා භූමිය වෙන් කිරීමේ කටයුත්ත තමන් විසින් භාර ගන්නා බවද ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා.

රාජ්‍ය ආයතන ලෙස ඇහැලියගොඩ කොට්ඨාශයේ පවතින විදුලි බල මණ්ඩලය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, වැනි රාජ්‍ය ආයතන ඒ සඳහා සම්බන්ධ කර ගැනීම සුදුසු බවත් එතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එම කමිටුව සඳහා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා හා තමන් ද මෙම ක්‍රීඩා කමිටුව සංවිධානය කිරීමේ කමිටුව සඳහා යෝජනා කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 11.50 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පලාත් පාලන සතියට සමගාමීව සංවිධානය කර ඇති වැඩසටහන් පෙළ ගැස්මට අදාළ ඇමුණුමෙහි සඳහන් වොලිබෝල් තරඟාවලිය ක්‍රිකට් තරඟාවලියක් ලෙස සංශෝධනය කරන බවත්, මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සියලු දෙනාගෙම සහයෝගය අවශ්‍ය බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.14 වන සමාරම්භක දිනයට සමගාමීව ජංගම සේවා ආදායම් ප්‍රවර්ධන දිනය යෙදී ඇති අතර, ඒ තුළින් හිඟ ආදායම් එකතු කිරීම හා ප්‍රවර්තන වර්ෂයේ ආදායම් එකතු කිරීම හා මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම සිදු කිරීමට නියමිත බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එදිනම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය එක්ව වෛද්‍ය සායනයක් හා දන්ත සායනයක් උතුරු කරඳන වසම තුළ පැවැත්වීට කටයුතු සංවිධානය කර ඇති බවත්, මේ සඳහා උතුරු කරඳන මන්ත්‍රීතුමාගේ සහයෝගය ලබා දෙන ලෙසත්, සිංහ සමාජය අක්ෂි සායනයක් පැවැත්වීමට සහයෝගය

ලබා දෙන බවට දැනුම් දී ඇති බවත්, එදිනම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා එක්ව ජංගම සේවා වැඩසටහන හේවායින්න වසම තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත්, ඒ හරහා පළමු දවසේ උපත් විවාහ හා මරණ සහතික ලබා දීම,ජාතික හැඳුනුම්පත් ලබා දීම වැනි කාර්යන් සිදු කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.15 වන දින වීථි පහන් නඩත්තුව හා ආදාහනාගාරය අලංකරණය කිරීම සිදු කරන බවත්, බෙරුවාන මාර්ගය බැකෝ යන්ත්‍රියක් යොදා පිළිසකර කිරීම හා පහළගම සුසාන භූමිය පවිත්‍ර කිරීම සිදු වන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.16 වන දින පරිසර හා රුක්රෝපන දිනයට සමගාමීව ආර්ථික දුෂ්කරතාවයෙන් පෙළෙන බෙරුවාන ජනපදයේ නිවාස 40 ක් සඳහා කොස් පැළ බෙදා දී සිදු කරන බවත්, ඒ වගේ ම ප්‍රවර්තන වර්ෂය සඳහා බදු ගෙවන ජනතාව දිරිමත් කිරීම වෙනුවෙන් සිහිවටන පැලයක් ලබා දීම සිදු කිරීම හා පුස්තකාල සඳහා පැළ බෙදා දීමක් ද සිදු වන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.17 වන දින සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය වෙනුවෙන් බෝ නොවන රෝග හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු වන බවත්, අක්ෂි සායනයක්, කාර්ය මණ්ඩල වෛද්‍ය සායනයක්, ධුමායන වැඩසටහනක් පොදු ස්ථානවල පැවැත්වෙන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.18 වන දින සාහිත්‍ය අධ්‍යාපන පුස්තකාල හා ක්‍රීඩා දිනය නිමිත්තෙන් පාසල් දරුවන් සඳහා කියවීමේ කඳවුරක් පලීගල විද්‍යාලයේ සිදු කරන බවත්, පුස්තකාල පාඨක සමාජ අතර විවාද තරගාවලියක් පැවැත්වෙන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.19 වන දින ඇහැලියගොඩ ආරාධිත ක්‍රිකට් කණ්ඩායම් අතර ප්‍රදර්ශනාත්මක තරඟයක් පැවැත්වෙන බවත්, සහතිකපත් ලබා දීම හා සමාජතිය එදිනට යෙදී ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අපේ මන්ත්‍රීවරියන් සහ නිලධාරිනියන් අතර තරඟයක්ද පැවැත්වීම සුදුසු බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා.

ක්‍රීඩාවට සහභාගි වන නොවන සියලු දෙනාටම ටී සර්ට් එකක් සකසා ගනිමු යැයි යෝජනා කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

17 (v) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
ඇහැලියගොඩ මහජන පුස්තකාලය නවීකරණය කිරීම සඳහා ඇමුණුම xvi හි සඳහන් භාණ්ඩ හා උපකරණ මිලදී ගෙන සැපයීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

18 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා .

විදුලි පහන් කණුවල බල්බ් බිම සිට ගැලවීමට සහ සවි කිරීමට හැකි උපකරණයක් මිලදී ගැනීම හෝ සුදුසු ආයතනයකින් සකසා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.52 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

විදුලි පහන් සවි කිරීම සඳහා එක් විදුලි කම්බිකරු මහතෙකු පමණක් සිටින බැවින්, විදුලි පහන් සවි කිරීමේ කාර්යක්ෂම තාවය අඩු වී ඇති බවත්, සමහර විදුලි බල මණ්ඩලවල මෙවැනි උපකර්ණ තිබෙන බවත්, තමන් එක් ආයතනයකිනි මෙවැනි උපකර්ණයක් සකස් කර ගැනීමේ හැකියාවක් පවතින්නේ ද යන්න විමසා සිටි විට , එවැනි උපකර්ණයක් සකස් කර දිය හැකි බව පැවසූ බවත්, තමා ඒ සම්බන්ධව AI තාක්ෂණය හරහාද සොයා බැලීමක් කළ බවත්, එවැනි අපකර්ණයක් සකස් කර ගැනීමට හැකියාවක් පවතින්නේ නම් විදුලි පහන් ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව තව තොරතුරු සොයා දීමට කටයුතු කරන ලෙසත්, සැපයුම්කරුවන් සම්බන්ධව ද තොරතුරු තිබේ නම් ලබා දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමාට ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
කල් දී නොමැති යෝජනා 3 ක් ලැබී තිබෙන බවත්, 2026.09.12 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමු කරන ලද යෝජනා බවත්, එදින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා ගරු මන්ත්‍රීවරු 7 දෙනෙක් සහභාගී වූ බවත්, මෙම යෝජනා සඳහා සභා තීරණයක් අවශ්‍ය බැවින් අද දින සභාවට යොමු කිරීමට කටයුතු කළ බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.55 ට නැවත සභාවට පැමිණෙන ලදී.

<u>කල් දී නොමැති යෝජනා.</u>

01 (i) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

2026.01.13 වන දින සාමාන්‍ය මහා සභා රැස්වීමේ දී ගන්නා ලද සභා **තීරණ අංක** 06.10 යටතේ 2026 වර්ෂයේ මහා සභා රැස්වීම් සඳහා කරන සංග්‍රහයන් සඳහා එක් සභාවාරයකට රුපියල් 12,000.00 ක උපරිමයකට යටත්ව වියදම් දැරීම සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

එහෙත් 2026.09.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී මුදල් සීමාවක් පනවා ගැනීමේ ගැටලු සහගත තත්ත්වක් උද්ගත වූ බැවින් ඉහත යෝජනාව පරීච්චින්න කිරීමට තීරණය කරන ලදී.එබැවින් ඉහත කී යෝජනාව පරීච්චින්න කිරීමටත්, මුදල් කාරක සභාවේ අනුමැතිය පරිදි සංග්‍රහ වියදම් දැරීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.56 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ වෙන තෙක් මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු සඳහා රුපියල් 12,000.00 ක් වූ මුදල් සීමාවක් තිබූ බවත්, නමුත් දුර ප්‍රදේශවල සිට පැමිණෙන මන්ත්‍රීවරුන් උදැසන කෑම පවා නොකා පැමිණෙන බවත්, මේ දක්වා ලබා දුන් සංග්‍රහය වෙනසක් කිරීම සඳහා යම් මුදලක් වැඩි කර කෑම පාර්සලයක් ලබා දීමට මුදල් කාරක සභාවේ දී තීරණය කළ බවත්, ඒ සඳහා සභාවේ අනුමැතිය මේ සඳහා ලබා ගැනීමට මෙම යෝජනාව සභාවට යොමු කල බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

01 (ii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අස්වැසුම ප්‍රතිලාභියෙකු වන යකුදාගොඩ වසමෙහි දන්දෙනිය ඇහැලියගොඩ පදිංචි කේ.ඩී. නන්දාවතී මියගේ සැමියා මිය ගොස් ඇති අතර ඇගේ දියණියගේ ස්වාමියා ද ඇය හැර ගොස් ඇත.ඇයට ආබාධිත දරුවෙකු ද සිටී.

අසරණව ඇති ඔවුන්ගේ නිවසෙහි වහලය අලුත්වැඩියාව සඳහා සහනයක් ලබාදෙන ලෙස ඇය විසින් 2026.09.02 දිනැතිව ඉල්ලීමක් සභාව වෙත යොමු කර ඇත.එබැවින් මෙම ඉල්ලීම සලකා බලා මෙම සභාවේ, ඇහැලියගොඩ පුස්තකාලයේ වහලය අලුත්වැඩියාවෙන් හා පැරණි සභා ගොඩනැගිල්ල වහලය අලුත්වැඩියාවෙන් ඉවත් කර ඇති අඩි 12 සෙවිලි තහඩු 12 ක් හා අඩි 10 සෙවිලි තහඩු 14 ක් නිවසේ වහලය සකස් කර ගැනීම සඳහා ඇය වෙත ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙම නිවස පරික්ෂාව සඳහා තමා සහභාගී වූ බවත්, එහිදී මෙම පවුල ඉතා අසරණ තත්ත්වයෙන් ජීවත් වන බව දැක ගැනීමට හැකි වූ බවත්, එම අය සඳහා පුස්තකාලයෙන් ඉවත් කළ සෙවිලි තහඩු ලබා දීමට හැකියාව තිබෙන බැවින්, එම තහඩු ලබා දීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළ බවත්, මෙම නිවැසියන් පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ද දැනුවත් ඇතැයි තමා සිතන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා පෙ.ව 11.58 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

මේ පුද්ගලයින්ගේ නිවස දන්දෙනිය ඇහැලියගොඩ දෙවන පටුමගෙහි පලමු නිවස වන බවත්, මෙම කාන්තාවගේ ස්වාමියා රෝගී තත්ත්වයෙන් සිට මිය ගොස් ඇති බවත්, ඇයගේ දියණියද ලබාල වයසේදී පලීගල ප්‍රදේශයේ පුද්ගලයෙකු සමඟ විවාහයක් කර ගෙන ඇති නමුත්, ඔහු ද මේ වන විට නිති කටයුත්තක් හේතුවෙන් පොලිස් භාරයේ සිටින බවත්, ඇගේ දරුවාද අසනීප තත්ත්වයෙන් පසුවන දරුවෙක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා ද එම ස්ථානය නිරීක්ෂන සඳහා සහභාගී වූ බවත්, එම නිවසේ වහලය උණ ගස් උපයෝගී කරගෙන සකසා ගෙන තිබෙන බවත්, එම උණ දඬු මේ වන විට දිරා ගොස් වහලයේ එක් පැත්තක් මේ වන විට කැඩී ඇති බවත්, ශ්‍රමදාන මාර්ගයෙන් මේ වන විට නිවස සැදීමේ කටයුතු සිදු කරමින් පවතින බවත්, මේ නිවසියන් සම්බන්ධව සභාවේ අවදානය යොමු කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මුදල් කාරක සභාවේදී ගත් තීරණයට වඩා වෙනස් විදිහක් මෙහි පවතින බවත්, ඇහැලියගොඩ පුස්තකාලයෙන් ඉවත් කළ ද්‍රව්‍යන් ලබා දීමට මුදල් කාරක සභාවේ තීරණය කළ බවත්, වර්ග අඩි ප්‍රමාණයන් සඳහන් කරමින් ඉල්ලීම කර

ඇති බවට ගරු සභාපතිතුමා එම අවස්ථාවේ සඳහන් කළ බවත්, මුදල් කාරක සබාවේ ගත් තීරණයට මෙය හාත්පසින් ම වෙනස් නිසා මේ පිලිබඳ විමසන බවත්, යෝජනාවට කිසිදු අකමැත්තක් නොමැති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
එම ලිපිය මඟින් ඉල්ලීම් කළ පරිදි අදාළ වර්ග අඩි ප්‍රමාණ වලින් ලබා දීමට සභාව සතුව එම ද්‍රව්‍ය නොමැති හෙයින් සභාව සතුව පවතින ප්‍රමාණයන් අනුව ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.
එය කිසිදු ප්‍රශ්නයක් නොමැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

01 (iii) ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ පොළ භූමියේ පිහිටා ඇති මාර ගස 2026.09.02 දින පෙ.ව 10.00 ට අවම ලංසුව රු.250,000.00 ක් සේ සලකා වෙන්දේසි කිරීමට කටයුතු සුදානම් කර තිබුණ ද වෙන්දේසිය සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවුණි.

එබැවින් අවම ලංසු මුදල රු. 100,000.00 ක් සේ සලකා නැවත වෙන්දේසි කිරීම සුදුසු බවට 2026.09.07 පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී තීරණය කරන ලදී.ඒ අනුව ඉහත සඳහන් මාර ගස අවම ලංසුව රු. 100,000.00 ක් ලෙස සලකා නැවත වෙන්දේසි කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මෙම මාර ගස එක පැත්තක් දිරා ගොස් කඩා වැටීමට පවා හැකියාවක් පවතින බවත්, ලක්ෂ පහක ලංසු මුදලක් තීරණය කිරීමට කාර්මික නිලධාරීතුමා ප්‍රකාශ කළ ද , එම මුදල් වටිනාකම වැඩි බැවින් එය ලක්ෂ 250, 000.00ක මුදල දක්වා අඩු කර වෙන්දේසි කිරීමට කටයුතු සුදානම් කළ ද, එම මුදල ද වැඩි නිසා දෝ කිසිවෙකු එදින වෙන්දේසියට නොපැමිණි බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මෙම මාර ගස ඉක්මනින් ඉවත් කර ගැනීමට අවශ්‍ය වන බැවින් හේ අවම ලංසු මුදල රු. 100,000.00 ක් වන අතර ඊට ඉහළ මුදලක් දක්වා ඉල්ලීම් කළ හැකි බවද ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා විසින් යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලද අතර, ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ඇ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

i.	ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය ii
ii.	මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා	-ඇමුණුම් ලේඛනය iii/iv/v
iii.	නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය vi
iv.	මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය vii/viii
v.	පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව	-ඇමුණුම් ලේඛනය ix

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාවේ 15 වෙනි යෝජනාව වෙත අවදානය යොමු කරන බවත්, "ඊළඟ සභා වාරයේ සභා යෝජනාවක් දමා ප්‍රාදේශිය ගොඩනැගිල්ලේ බිම්මහලේ ඇති පොදු වැසිකිලිය නවීකරණය කිරීමට කටයුතු කර දෙන ලෙස දන්වා සිටිමි." ලෙස සටහන් කර ඇති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

15(i) යෝජනාව මඟින් එය සභා අනුමැතිය සඳහා යොමු කර ඇති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙම වැසිකිලිය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයේ පවතින බව සඳහන් කරමින් සමාජ මාධ්‍ය තුළ ද වාර්තා වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාවේ අංක 4 යටතේ, "බේරුවාන කසල අංගනයේ සවි කර ඇති cctv කැමරා පද්ධතියේ අඩුපාඩු සකස් කර කඩිනමින් සකස් කර දෙන ලෙස දන්වන ලදී" යනුවෙන් වාර්තා කර ඇති බවත් ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 12.05 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 12.05 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.

Online බැලීමට හැකි පරිදි රවුටර් එක සවි කර සකසා දෙන ලෙස එයින් සඳහන් කර ඇති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

vi. කාර්මිකසේවා කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය x

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාවේ දෙවැනි පිටුවේ, "විමධ්‍යගත අයවැය වැඩසටහන - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාතිංගොඩ වසමේ ක්‍රියාත්මක වීමට අනුමත වී ඇති තලගහමුල ඉසුරු පෙදෙස මාර්ගය සංවර්ධනය කිරීම" ලෙස තිබෙන බවත්,ඒ සඳහා "කාර්මික සේවා කාරක සභාවෙන් ස්ථානීය පරීක්ෂණයක් කිරීමට තීරණය කරන ලදී" යනුවෙන් තිබෙන බවත්, ස්ථානිය පරීක්ෂණයක් සිදු කරන්නේ යම් ගැටලු සහගත තත්ත්වයක් නිසා ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කාර්මික සේවා කාරක සභාවේ සභාපතිතුමාට මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා.

මෙම ව්‍යාපෘතිය කලින් ප්‍රාදේහිය සභාව විසින් සිදු කළ ද, මෙම ව්‍යාපෘතිය වර්තමානයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් සිදු කරන බව ද, එහි ලෙවලය නියමිත ප්‍රමිතින්ට අනුව නොමැති නිසා ජලය පිරිමට ලක්වන හෙයින් ප්‍රාදේශිය සභාව විසින් කලින් කළ ව්‍යාපෘතියෙන් කොටසක් කඩා ඉවත් කිරිමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇති බවත්, ඒ සඳහා කාර්මික සේවා කාරක සභාවෙන් ස්ථානිය පරීක්ෂණයක් සිදු කර අනුමැතිය ලබා දුන් බවත්, ව්‍යාපෘතිය ඉදිරියට සිදු කිරිම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් සිදු කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

vii. ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය xi

(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

i. 2026 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xii
ii. 2026 අගෝස්තු මස හිඟ ආදායම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xiii
iii. 2026 අගෝස්තු මස ගෙවීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xiv

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා ප.ව 12.09 ට සභා ගර්භයෙන් පිට විය.

(ඒ) සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

කුරුවිට ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මැතිතුමා හදිසි රෝගාබාධයකින් මිය ගොස් ඇති බවත්, අද දින සවස එම අවමංගල්‍ය කටයුත්ත සඳහා සහගීවිම අත්‍යවශ්‍ය බැවින් මන්ත්‍රී පැහැදිලි කරිම් සඳහා ලබා ගන්නා වූ කාලය කෙටි කර දීමට කටයුතු කරනවා නම් හොඳ බවත්, මෙ ඉල්ලිමක් පමණක් බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ සහෝදරයාගේ අවමංගලය කටයුතු සිදු කිරීමට ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරයේ දී සිදු කළ අතර, එම ආදාහන කටයුතු සිදු කිරිමට අවශ්‍ය විදුලිය සපයා ගැනිමේ දී ගැටලු සහගත තත්ත්වයක් ඇති වූ බවත්, එහි විදුලිය සපයා ගැනිමට යොදා ඇති ටයිමරය නැමැති උපකරණය සිරවෙන බව ආදාහනාගාර සේවකයන් පැවසූ බවත්, විශාල පරිශ්‍රමයක් දරා සේවක මහතා එය සකසා ගත් බවත්, ඒ තුලින් ගිනි ගැනිමට හැකි බව පැවසූ බවත්, එම නිසා ඒ සම්බන්ධව ද ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා ප.ව 12.11 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෝරගල හොරගොඩ මාර්ගයේ මාන පඳුරු ඉවත් කිරිමට කටයුතු කළත්, එම කාර්ය භාගෙට සිදු කර ඇති බවත්, තව සතියක් දෙකක් යන විට නැවත් මාන පඳුරු වැවිමට හැකි බවත්, නමුත් ඒ ආකාරයෙන් හෝ සුද්ද කර දීම පිළිබඳව ස්තුතිය පුද කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

විලේගොඩ බෝපැත්ත මාර්ගයේ බෙකරිය අසල ප්‍රධාන මාර්ගයේ පැති බැම්මේ බෝක්කු කටට ඉඩ තබා ඇති බවත්, නමුත් කොන්ත්‍රාත්කරු මේවන විට වැඩ අවසන් කර ගොස් ඇති බවත්, පාර දෙසට කාණුවක් වගේ අඩි දෙකක පමණ ප්‍රමාණයක් තබා ඇති බවත්, බෝක්කු දෙකට ජලය බැස යන ස්ථානයට කොන්ක්‍රිට් ලැල්ලක් නොමැති හෙයින් යම් අනතුරක් වීමේ අවධානමක් පවතින බවත්, එමනිසා කොන්ත්‍රාත්කරුට වැඩ අවසන් මුදල් ගෙවිමට පෙර එය සකසා දෙන ලෙසත්, සියලු දෙනාගේ දැන ගැනිම සඳහා තමා එම ස්ථානයේ ඡායා රූපයක් ගෙන සභික මණ්ඩලයේ වට්ස්ඇප්

සමුහයට යොමු කිරීමට කටයුතු කරන බවත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

මහින්ද රාජා නැමැති පුද්ගලයාගේ නිවසට ගමන් ගන්නා මාර්ගයේ ගැටලුවක් සම්බන්ධව ගියවර සභාවේ දී ප්‍රකාශ කළ බවත්, LRC මැනුම් කටයුතු නොකර අසාධාරණ ලෙස එක් පාර්ශවයකට පමණක් වාසි සහගත ලෙස කටයුතු කරමින් පාර හා පොදු නාන ළිඳට ගමන් ගන්නා පාර වැසීමට හදන බවත්, එම පොදු නාන ළිඳ සංවර්ධනය කර දෙන ලෙසට තමා විසින් යෝජනාවක් සිදු කළ බවත්, පොදු නාන ළිඳ ඉක්මනින් සංවර්ධනය කළ හොත් පොදු නාන ළිඳට හෝ මෙම මාර්ගය දීමට සිදු වන බවත්, එසේ හෝ සිදු කර එම මාර්ගය රැක දෙන ලෙස ගරු සභාපතිතුමාගේ ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

හොරගොඩ ප්‍රදේහයේ විදුලි පහන් 11 ක් සවි කල බවත්, 8 ක් මේවන විට පිච්චී ගොස් ඇති බවත්, එම විදුලි පහන් හැකි ඉක්මනින් සවි කර දීමට කටයුතු කර දෙන ලෙසට ඉල්ලීමක් කරන බව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ප.ව 12.13 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

අද දින සභාවේ වැදගත් එක් සිදු වීමක් දැක ගැනීමට හැකි වූ බවත්, එක් නිලධාරී මහත්මයෙකු මෙම සභාවට පැමිණ එතුමාගෙන් සිදු වූ වැරැද්දට සමාව ගැනීම සිදු කළ බවත්, එය බොහොම වැදගත් අවස්ථාවක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
වෙ
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සකසා ඇති සභික මණ්ඩලය නම් වට්ස්ඇප් සමුහය මේ වන විටත් එය ක්‍රියාත්මක කරන ක්‍රියාතමකකරු කවුදැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

මේවනකන් ජන සමාජය පැවතගෙන ආවේ සම්ප්‍රධායෙන් බවත්, දළදා මාලිගාවේ පෙරහැර පවත්වා දිය කපන ලෙසට බුදු රජාණන් වහන්සේ දේශනා කර නොමැති බවත්, එය සම්ප්‍රධාය අනුව සිදු කරන බවත්, පාර්ලිමේන්තුවේ අයවැය විවාදයෙන් පසු තේ පැන් සංග්‍රහයක් දීමට පාර්ලිමේන්තු සම්ප්‍රධායක් පවතින බවත්, ඒ තුළින් විනයක් සැකසීම බලාපොරොත්තු වන බවත්, එමනිසා මේ සභික මණ්ඩලය නම් වට්ස්ඇප් සමුහය සඳහා ගරු සභාපතිතුමාගේ නායකත්වයෙන් එක් admin කෙනෙකු යෙදවීම ප්‍රමාණවත් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නමුත් මේවන විටත් මෙය දුරදිග නොයැවිය යුතු බවත්, ගරු සභාපතිතුමා ප්‍රඥාවෙන් ඇසිය යුතු කාරණයක් බවත්, ප්‍රාදේශිය සභාවේ විපක්ෂයක් නැති වුවත්, සම්ප්‍රධායට අනුව ප්‍රාදේශිය සභාවේද විපක්ෂයක් තිබිය යුතු බවත්, විපක්ෂ නායකයෙක් සිටිය යුතු බවත්, මේ වියවුල් භාවය ඇති වීමට මුලික තැන එය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශිය සභාවේ සිටින විපක්ෂ කණ්ඩායමේ සියලු දෙනාම ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා, ආදී ප්‍රාදේශිය සභාවේ හිටපු අය වශයෙනුත්, මෙහි සිටින එක එක පක්ෂ නියෝජනය කරන පක්ෂවල නායකයන් බවත්, නමුත් තමන් මේ අවස්ථාවේ නමින් ප්‍රකාශයක් කරන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා වට්ස්ඇප් සමුහයට යොමු කරලා තියෙනවා “සොකන්ව පෝම් කරලා group එකෙන් අයින් කරවලා, අන්තිමට එතුමන්ලා තැන තැන කියව කියව ගිහින් අපරාදෙ අයින් වුණේ කියලා.” මේ සොක්කො කියන වචනය මේවන විටත් අයින් කර නොමැති බවත්, මෙහි සොක්කො නොමැති බවත්, මෙහි සිටින්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු බවත්, මෙහි සොක්කො නොමැති බවත්, කරුණාකර එම වචනය ඉවත් කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විපක්ෂය තුළ සොක්කන් නොමැති බවත්, ඔබ කණ්ඩායමේ සමහරවිට සොක්කන් සිටීමට පුළුවන් බවත්, විනයක් ඇති විපක්ෂයක් විදිහට තිරණය කළා මෙයින් ඉවත් වෙන්න.කාගෙවත් අතකොලු බවට පරිවර්තනය වී නොමැති බවත්, සමඟි ජන බලවේගය කණ්ඩායමේ නිල බලය තමාට හාරදී තිබෙන බවත්, තම පක්ෂයෙන් මේ සභාව 5 දෙනෙකු නියෝජනය කරන බවත්, මෙහි පක්ෂ කිහිපයක් නියෝජනය කරන මන්ත්‍රීවරු මෙම සභාවේ සිටින බවත්, ඒ සියලු දෙනාටම නායකයින් සිටින බවත්, ඒ නිසා එම ප්‍රකාශය ඉවත් කිරීමට හෝ සමාව ගැනීම සිදු කළ යුතු බව මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

වට්ස්ඇප් සමුහයේ සොක්කො යනුවෙන් සඳහන් කර ඇති සටහන තමා ද දුටු බවත්, සොක්කොවත් බත්බැලයොත් නෙවන අතර සමගි ජන බලවේගයේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු බවත්, එමනිසා එවැනි ආමන්ත්‍රනයන් සුදුසු නොමැති

බවත්, 1982 සිට තමන් දේශපාලනය කරන බවත්, 1986 රැකියාවට යොමු බවත්, රැකියාවත් සමඟ දේශපාලනයද කළ නිසා වර්තමානයේ මේ තත්ත්වයෙන් සිටින බවත්, බෝපැත්ත ග්‍රාමයට තමන්ගේ දේශපාලන කාලය තුළ බස්රථයක්, ඇගළුම් කම්හලක් ලබා ගත් බවත්,විලේගොඩ මීන්නාන මාර්ගය සකස් කර නොතුබූ කාලයක එම මාර්ගය සකස් කළ බවත්, බෝපැත්ත ග්‍රාමයට විදුලිය ලබා ගත් බවත්, එවැනි සංවර්ධන වැඩ කටයුතු රාශියක් එවක සිදු කරගත් බවත්, සොක්කෝ ලෙස සිට නොව දේශපාලනයේ නියලෙන පුද්ගලයන් ලෙස එම කාර්යන් සිදු කර ගත් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා ප.ව 10.25 ට සභා ගර්භයෙන් පිට විය.

විපක්ෂ කණ්ඩායම ඉදිපත් කරන යෝජනා අයවැය ප්‍රතිපාදන නොමැති බව දන්වමින් ඉවත් කිරීම සිදු කරන බවත්, ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත්, තමාගේ ද මීට ඉහත දී ඉදිරිපත් කළ යෝජනාවක් සඳහා ද අයවැය නොමැති බව දන්වා ලිඛිතව දැනුම් දීමක් සිදු කර තිබූ බවත්, එය තමා දකින්නේ මල්වට්ටිය අතට දී බඩට පයින් ගහනවා වගේ ක්‍රියාවක් බවත්, විපක්ෂයේ යෝජනා ඇතුළත් කිරීමට අවස්ථාවක් නොදී ඒකාධිපති ප්‍රතිපත්තියක් ගෙන යන බව ඉන් අදහස් වන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බෝපැත්ත සුසාන භූමියේ සංවර්ධන කටයුතු වලදී සංවර්ධනය සඳහා යෙද වූ මුදල් කාර්මික නිලධාරීතුමත්, තාක්ෂණික නිලධාරීතුමත් එම මුදල් ගසා කාලා කියා තමන් ප්‍රචාරයක් යවන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් ප්‍රකාශ කර ඇති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.නමුත් ගරු සභාපතිතුමාගෙන් හා ලේකම්තුමාගේ අත්සනින් යුතු මෙම වාර්තාවේ පෙන්වා ඇති මුදල්, ඒ සඳහා වියදම් කර ඇති මුදල් කොපමණ ද යන්න ගම්වාසින් තමාගෙන් විමසන විට, මෙම වාර්තාවේ සඳහන් මුදල් ප්‍රමාණයන් වියදම් කළ මුදල් ප්‍රමාණයන් තමා විසින් එම ජනතාවට ප්‍රකාශ කරන බවත්, ඉතුරු මුදල් පිළිබඳ විමසන විට ඒ පිළිබඳ තමා නොදන්නා බව ප්‍රකාශ කරන බව හැරෙන්නට මෙම නිලධාරීන් ගසා කෑවා යන ප්‍රකාශයක් තමා සිදු කළ නොමැති බවත් එය ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය විසින් සිදු කරන සාවද්‍ය චෝදනාක් බවත්, ඒ නිසා එවැනි චෝදනා සුදුසු නැති බව ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

කුරුවිට ප්‍රාදේශිය සභාවේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ හදිසියේ අභාවප්‍රාප්ත වූ බවත්, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සංවේගය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 12.23 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 12.24 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ජාතික ජනබලවේග ආණ්ඩුව පත් වී මේ මස 21 වන දිනට වර්ෂ දෙකක් සම්පූර්ණ වීම නිමිත්තෙන් කෙටි සටහනක් තැබීමට තමා සිතන බවත්, එලෙස ආණ්ඩු බලය තම පක්ෂයට ලැබෙන විට ආර්ථික වශයෙන් සැම ක්ෂේත්‍රයක් ම බිඳවැටුණු රාජ්‍යක් ලැබුණු බවත්, 2025 වර්ෂයේ රාජ්‍ය ආදායම .... බවත්, රාජ්‍ය ආදායම 5 ට අඩු කර ගන්නත් බැරි වෙයි යන මට්ටමක තිබූ බවත්, නමුත් මේවන විට අයවැය හිඟය 2.3 දක්වා අඩු වී ඇති බවත්, 1957 න් පසු (සෝෂාව)ජාත්‍යන්තර මුල්‍ය අරමුදලින් ප්‍රකාශ කළේ එම ඉලක්කම් වලට යෑමට 15.3 ක ආදායමකට යායුතු බවත්, නමුත් කිසවෙක් අපේක්ෂා නොකළ 16.9 දක්වා හා ඊටත් එහාට ගිය අදායම් වර්ධනයක් ඇති කරගත් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 12.24 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම වසර දෙකක කාලය තුළ ආපදා තත්ත්ව වැනි කාරණා දෙකකට මුහුණ දීමට සිදු වූ බවත්,එම ආපදා තත්ත්වයෙන් හානි වූ දේ යළි ගොඩනැංවීමට කෝටි පනස්දහසක මුදලක් රජයක් වශයෙන් යෙදවීමට හැකි වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා ප.ව 12.25 ට සභා ගර්භයෙන් පිට විය.

ඉරාන යුද්ධයක් ඇති වූ බවත්, ඒ තුළින් තෙල් හා බලශක්ති අර්බුදයකට මුහුණ දීමට සිදු වූ බවත්, පෙට්ට්‍රල් ලීටරයකට රුපියල් 25.00 ක් ඩීසල් ලීටරයකට රුපියල් 100.00 ප්‍රමාණයක ආසන්නව රජයේ මුදල් යොදවා එය අර්බුදයකට යා

නොදී පවත්වාගෙන ගිය බවත්, අප්‍රේල් මස , මැයි මස වෙන විට තෙල් හිඟයක් ඇති වෙයැයි යම් ප්‍රකාශ ආණ්ඩු විරෝධිව සිදු වුවත්, හොද කළමනාකරණයකින් යුතුව පෝලිම් වල ජනතාව නොතියා එම කාර්යන් සාර්ථකව කරගත් බවත්, මේ වර්ෂ දෙක ඉතාම හොඳ කළමනාකරණයකින ගෙන ගිය බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පක්ෂ ගණාවක් තිබෙනවා කියා සිතා ගෙන සිටියද,මේවන විට විවිධ සමුළු පවත්වන බවත්, එහෙත් ඒ සැම සමුලුවක ම පවතින්නේ එකම පොටෝ කොපි ටික බවත්, එය කුමන පක්ෂයේ ද කියා තමා නොදන්නා බවත්, කලු දේශපාලනය තම පක්ෂය නවතා ඇති බවත්, (සෝෂාව)

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ජාතික දේශපාලනය සම්බන්ධව කතා නොකර සභාවට අවශ්‍ය කාරනා පමණක් කතා කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාට ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

සභාවක් ලෙස මෙම වර්ෂ දෙක තුළ වසමක වැඩකටයුතු කිරීමේ දී, අවුරුදු 30 ක් 40 ක් වසම්වල සිදු නොකර අතහැර දමා ඇති සංවර්ධන වැඩ කටයුතු කිහිපයක් ආරම්භ කර ඇති බවත්, කෝටි ගණන් වැය කොට සෑදු වල් බිහි වී ගිය ගොඩනැගිලි තිබූ බවත්, කොමිස් ගත් ඒවා තිබූ බවත්, අගල් දෙක තුනක කොන්ක්‍රීට් තට්ටු දමන ලද ස්ථාන තිබූ බවත්, තමන්ගේ ඥාතීන් ගෙවල්ලට යන මාර්ග සඳහා කොන්ක්‍රීට් දමා තිබූ බවත්, නමුත් මේවන විට විධිමත්ව සංවර්ධන කටයුතු එම ප්‍රදේශවල සිදු වන බවත්, ඒ අනුව තමාගේ කෙටි පැහැදිලි කිරීම අවසන් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම සභාවේ ඉතාමත් ම කණගාටුදායක තත්ත්වයක් පවතින බවත්, මහත්මා දේශපාලනය කරන විට, අනිකෙක්ගේ කතාවට ඇහුන් කන්දීමට හැකියාවක් නැති තත්ත්වයක් උදා වී ඇති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

මෝරගල ක්‍රීඩා පිට්ටනියේ කාණුව පිරිසිදු කර සැකසිම ud වෙතින් සිදු කරන බවට ඔබතුමා විසින් දැනුම් දී තිබෙන බවත් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් ගරු සභාපතිතුමාගෙන් බලාපොරොත්තු වන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම කාර්ය ඉඩම් ගොඩ කිරීමේ අධිකාරිය SLDC විසින් සිදු කරන බවත්, එම කොන්ත්‍රාත්තුව බාර ගෙන ඇති බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ගියවර තමා විසින් සඳහන් කළ යෝජනාව සඳහා,"ඇහැලියගොඩ ජාතික ජනබලවේග පක්ෂ සම්බන්ධීකරණ කාර්යාලය ඉදිරිපිට ඇති විශාල පිහිඹිය ගස අවධානම් සහිත ගසක් බැවින්, එම ගස ඉතා ඉක්මනින් කපා ඉවත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ඒ සම්බන්ධව නොපමාව කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙමි" යනුවෙන් ලේකම්තුමාගේ අත්සනින් යුතු ලිපියක් ලැබී ඇති බවත්, නමුත් එම ගස දිරා පත්වී ඇති කොටස ද සමඟ මේවන තෙක් ද පවතින බවත්, ඒ සම්බන්ධව තමා විසින් ප්‍රදේශයේ මන්ත්‍රීතුමියද දැනුවත් කළ බවත්, නමුත් ඒ සඳහා කිසිවෙකු ක්‍රියාත්මක වී නොමැති බවත් එය දැඩි අවධානම් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා ප.ව 12.33 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ලිපිවලට කඩදාසිවලට සීමා වී තේරුමක් නොමැති බවත්, ඒ සම්බන්ධව හැකි ඉක්මනින් ක්‍රියාත්මක විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින න්‍යාය පත්‍රයේ යෝජනාවලින් 9 ක් 11 ක් සංවර්ධන යෝජනා ඇතුළත් වී ඇති බවත්, මෙය ඔබතුමාගේ දැනුවත් වීමෙන් තොරව සිදු වන ක්‍රියාවක් ලෙස තමා දන්නා බවත්, මේ සඳහා අදෘෂ්‍යමාන බලවේගයක් තිබෙන බවත්, මෙසේ සිදු නොකළ යුතු බවත්, ගරු සභාපතිතුමා පක්ෂ විපක්ෂ සියල්ලන්ගේ ම සභාපතිවරයා බවත්, න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කිරීමට විපක්ෂ කණ්ඩායමට ද අවස්ථාව ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බවත් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව නියෝජනය කරන ගම්මානවල තිබෙන්නා වූ අඩුපාඩු මිසක් තම පුද්ගලික කාර්යන් ඉටු කර ගැනීමට යෝජනා ඉදිරිපත් නොකරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ බුලුගහපිටිය හන්දියේ සිට පලීගල දක්වා තිබෙන වෙල්යාය ප්‍රදේශයන්ගේ විදුලි පහන් නොමැති බවත්,එය අවධානම් තත්ත්වයේ පවතින ප්‍රදේශයක් බවත්, එම විදුලි පහන් කඩිනමින් සවිකර දෙන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇහැලියගොඩ කිරිඇල්ල ප්‍රධාන මාර්ගයේ අලුතින් සවි කළ විදුලි පහන්ද අක්‍රිය වී ඇති බවත්, විදුලි පහන් මෙවන විට සභාවට ගෙනවිත් තිබෙන බැවින් එයද සවි කර දෙන ලෙස ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නාකන්දල සිට මැනික්දොළ දක්වා ඇහැලියගොඩ සභා ප්‍රදේශයට අයත් බවත්, එම ප්‍රදේශයට සවි කළ විදුලි පහන්ද අවුරුද්දක් යෑමට ප්‍රථම අක්‍රිය වී ඇති බවත්, කඨින පිංකම් ද සිදු කිරීමට ඉතා ආසන්න බැවින් එම විදුලි පහන් ද නැවත සවි කර දෙන ලෙස ඉල්ලීමක් කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇන්ටිජන් කතාව Group විශාල ප්‍රමාණයක ප්‍රචාරය වූ බවත්, බොහෝ දෙනෙක් මේ සම්බන්ධව නොදන්න බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මන්ත්‍රීතුමා හෝ මරික්කාර් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රශ්න කිරීමක් බවත්, එහි ආණ්ඩු පක්ෂයේ ඇමතිතුමා ඇන්ටිජන් සම්බන්ධ විග්‍රහයක් සිදු කරන බවත් (සෝෂාව)

“ජාතිවාදය අවුලවපු.රටටම නයි ඇරලා රටම අගාධයට දාන්න උඩගෙඩි දුන්න ජඩ මාධ්‍ය හිමිකරුවෙකුගෙ පක්ෂයක කෙනෙක්ට, විස්සකගෙ නිශ්චිත බලයකින් මාලිමාවේ සභාපතිවරයෙක් ඉන්න...” (සෝෂාව) 2019 වර්ෂයේ කැලණි විහාරයේ යම් සිදු වීමක් වීඩියෝගත කිරීමේ දී (සෝෂාව) ආණ්ඩුවට කඩේ යන ප්‍රධාන මාධ්‍ය හා මාධ්‍ය නාලිකාවලින් මේ සිදුවීම ප්‍රචර්ධනය කළ බවත්, බුදු රජාණන්වහන්සේ තෙවරක් වැඩිය කැළණිය.මෙය බෞද්ධ ස්ථානයක්.අවසන්වරටද බුදුරජාණන් වහන්සේ කැලනියට වැඩම කර ඇති බවත්, පෝය දිය සියලු නාලිකාවලින් එම ස්ථානයේ වැඩසටහන් සිදු කරන බවත්, එම ස්ථානයේ යම් සිදුවීමක් වූ විට එය විකාශනය කර ප්‍රචාරය කළ විට (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප.ව 12.35 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනාම සභාවට අදාළ කාරණා පමණක් කතා කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

ආණ්ඩු පක්ෂය ප්‍රචර්ධනය කරන මාධ්‍ය නාලිකාවලින්ද, ත්‍රස්තවාදය ප්‍රචර්ධනය කරන නාලිකාවලිනුත් මෙය ප්‍රචර්ධනය කළ බවත්, (සෝෂාව) ජනාධිපතිතුමා කළ ප්‍රකාශයෙන් LTTE සංවිධානය ප්‍රචර්ධනය කරනවා රට දැය බෙරා ගත්ත නායකයෝ සහ ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ජාත්‍යන්තරයේ අපකීර්තියට පත් කරන්නට, අපේ රණවිරුවන් අත්අඩංතුවට ගෙන හිර කිරීමට ඉදිරියට වැඩ සටහන් සිදු කරගෙන යන බවත්, ආණ්ඩුවේ එක් මන්ත්‍රීවරයෙක්වත් මේ කරන දෙය වැරදි යැයි කිසිවකු ප්‍රකාශ නොකළ බවත්, (සෝෂාව)
පලෙයි කැලේ අක්කර 30 ක් 40 ක් සුද්ද කර, මහල් 3 ක 4 ක ගොඩනැගිල්ලක් සාදා (සෝෂාව) වාද විවාද කරන විට ආණ්ඩු පක්ෂය කියනවා එළවළු වගා කළා කියනවා.ඇගලුම් කළා කියනවා.ගරු සභාපතිතුමනි කුමනහෝ පුද්ගලයෙක් ඉඩමක් සුද්ද කර වගාවක් කළොත් හෝ අත්තක් හරි දර කැල්ලක් කැපුවොත් අනිවාර්යෙන් ම මාස 6 කට ඒ ජනතාව හිරේ යවනවා. (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා ප.ව 12.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප.ව 12.40 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප.ව 12.43 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මෙය රීති ප්‍රශ්නයක්. මන්ත්‍රිවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් උපුටා දැක්වීමට අවසර ලබා ගත්තේය. උපුටා ගැනීම
32-2 "සාමාන්‍ය සභා රැස්වීමකදී කිසියම් සභිකවරයෙකු විසින් පොදු අරමුණක් වෙනුවෙන් කළ යුතු පෞද්ගලික පැහැදිලි කිරීම් ඇත්නම් ඒ සඳහා වන ලිඛිත ඉල්ලීමක් සභා රැස්වීම ආරම්භ වීමට පූර්වයෙන් සභාපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිය යුතුය."මන්ත්‍රිවර්න්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්වල අදහස් දැක්වීමය කුමන හෝ මන්ත්‍රිවරයෙක් අදහස් කර සිටිනවා නම් එ ද සභාපතිවරයාට කලින් දැනුම් දිය යුතු බවත්, නමුත් එය කිසිදිනක සිදු කර නොමැති බවත්, ඒ ලබා දී ඇති අවස්ථාව "32-05 පෞද්ගලික පැහැදිලි කිරීම් සිදු කරන සෑම සභිකවරයෙකුම පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා ඉල්ලීම් කිරීමට පදනම් කරුණට අදාළව පමණක් කතා කළ යුතු අතර, ඒ සඳහා ඔහු වෙත වෙන් කර දී ඇති කාල සීමාව තුළ පමණක් අදහස් දැක්වීම සඳහා මූලාසනය විසින් අවසර ලබා දීම සිදු කළ යුතුය.32-1 හි "සභාවේ සාමාන්‍ය රැස්වීමේ දී සභිකවරුන්ගේ ්පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා වෙන් කළ යුතු කාල සීමාව පිළිබඳ සභාව විසින් පූර්වයෙන් තීරණය කර තිබිය යුතු අතර, එසේ වෙන් කරනු ලබන කාල සීමාව තුළ එක් සභිකවරයෙක් සඳහා ලබා දෙන උපරිම කාල සීමාව සභාව තීරණය කර තිබිය යුතුය."
ඉදිරියේ දී සභිකවරුන්ට සභා රිති සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරමින් පවතින බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

තමන් විසින් කතා කරන මාතෘ කාවට අදාළව පමණක් කෙටියෙන් කතා කරන ලෙසට සැම විටම දැනුම් දෙන බවත්, සබාවට අදාළ නොවන කාරණා සම්බන්ධව කතා කිරීම තේරුමක් නොමැති බවත් සිය දහස්වාරයක් ප්‍රකාශ කර ඇති බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා කළ කාරණාවේදී, අවසර ගැනීමක් අවශ්‍ය බව සඳහන් වන්නේ සභික වරයෙක් පොදු අරමුණක් වෙනුවෙන් කතා කිරීමට බලාපොරොත්තු වෙනවානම් පමණක් බවත්, මන්ත්‍රිතුමාගේ පුද්ගලික අදහස් දැක්වීමක් නොවන කුමක් හෝ සුවිශේෂී අරමුණක් සඳහා තරුනු දැක්වීම මෙහිදී අදහස් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

පන්ගොඩැල්ල ජල යෝජනා ක්‍රමයේ ජලය පානය කිරීමට මේ වන විටත් නොහැකි තත්ත්වයෙන් පසුවන බවත්. මේ සම්බන්ධව ගියවර සබාවාරයකදී කරුනු පැහැදිලි කිරීමක් තමා විසින් සිදු කළ බවත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවදානය යොමු කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ ආකාරයට සබාව තුළ වාද විවාද සිදු කළ ද සභික මන්ත්‍රිවරුන්ගේ සහබාගිත්වයෙන් පළාත් පාලන සතියට සමගාමීව ක්‍රීඩා තරගයක් ද පැවැත්වීමට නියමිත බවත්, ඒ සඳහා සියලුම මන්ත්‍රිවරුන් සහාගිවිය යුතු බවත්, සොක්කො බොක්කො වැනි අනවශ්‍ය කාරණා සභික වට්ස්ඇප් ගෘප් එකට නොදැමිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ සහොදරයාගේ අභාවය වෙනුවෙන් සභාවේ සියලු දෙනාගේ ම ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.
තම සහෝදරයාගේ අභාවය දැනුවත් වීමෙන් පසු ඒ අවස්ථාවට පැමිණ අවසන් ගෞරව දැක්වූ ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීන්ට හා ගරු මන්ත්‍රිතුමියන්ට ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා යෝජනා කළ තම්මෝවිට මාර්ගය අබලන් වෙමින් පවතින බැවින් කඩිනමින් සංවර්ධනය කළ යුතු මාර්ගයක් බවත්, දැනටමත් බස් ගමනා ගමනයට අවභිරතා ඇති ඇති බවත්, මාර්ගයක කඩිනමින් සංවර්ධනය නොකළ හොත් බස් ගමනාගමනය කෙටි කාලයක් තුළ නවතා දැමීමට සිදු

වන බවත්, දම්මුල්ල මාර්ගය සඳහා ගරු සභාපතිතුමාගේ මැදිහත් වීම හැකි ඉක්මනින් ලබා දෙන ලෙස ගෞරවනීය ඉල්ලීමක් සිදු කරන බවත්, බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලට ආබාධිත පුද්ගලයින්ගේ පහසුව සඳහා විදුලි ඝෝපානයක් සවි කිරීමට යෝජනා වූ බවත්, නව සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල වෙනත් ස්ථානයක් වෙත රැගෙන යාමට අපේක්ෂා කරන බව මීට ඉහතදී ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළ බවත්, ඒ අනුව ඔබතුමන්ලගේ ප්‍රතිපත්තිමය කාරණාවලදී මෙ අනවශ්‍ය වියදමක් ලෙස නොසැලකෙන්නේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා ප.ව 12.50 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා පෙ.ව 10.25 ට සභා ගර්භයෙන් පිට විය.

බෝපැත්ත මාර්ගයේ විදුලි පහන් දැල් වෙන බවත්, එම විදුලි පහන් කුමක් හෝ සිස්ටම් එකක් මඟින් දැල්වෙන වේලාව හා නිවෙන වෙලාව සිදුවනවාද කියා තමාට පොඩි ගැටලුකාරී තත්ත්වයක් ඇති බවත්, රාත්‍රී 9 ටත් හා උදැසන 9 ටත් විදුලි පහන් දැල්වී තිබෙන බවත්, විදුලි අර්බුදයක් ඇතිවිමට හේතු වන වාතාවරණය තුළ මේ සම්බන්දව විශේෂ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දැනට පවතින පුස්තකාලය සංවර්ධනය කර පාඨකයන්ට යම් සහනයක් ලබා දීමට සිදු කරන මැදිහත් වීමට ස්තුති කිරීමට මෙය අවස්තාවක් කර ගන්නා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ වෙළෙඳන් කීපදෙනෙක් පමණක් වෙළඳාම් කටයුතු සිදු කරමින් පොළ මේ තත්ත්වයෙන් හෝ පවත්වාගෙන යන බවත්, පොළ භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී පොළෙහි වෙළෙන්දුන්ට කිසිදු හානියක් නොවන ආකාරයෙන් එම කටයුතු කළ යුතු බවත් අවධාරණය කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ආණ්ඩුවේ වර්ෂ දෙකක කාලය තුළ රජයේ ක්‍රියාකලාපය පිළිබඳව එක් මන්ත්‍රීවරයෙක් විසින් කරුණු පැහැදිලි කරනු ලැබූ බවත්, දිට්වා ආපදාවට මුහුණ දුන් ආකාරයත් එහිදි පැහැදිලි කළ බවත්, දිට්වා ආපදාවට මුහුණ දුන් පුද්ගලයන් සමඟ ඒ සම්බන්ධව සාකච්චා කළා නම් මෙම රජයේ ක්‍රියාකලාපය හොඳ හැටි අවබෝධ කර ගත හැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේ ම ගොවිමහතුන්ගේ ප්‍රශ්න පිළිබඳ මැදිහත් වීමද ගොවිමහතුන් සමඟ සාකඡ්ඡා කිරීමෙන් අවබොධ කර ගත හැකි බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තෙල් සංස්ථාව ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් ණය මුදලක් ලබා ගෙන ඇති බවත්, එම ණය පියවීම සඳහා තෙල් ලීටරයකට රුපියල් 50.00 ක මුදලක් එකතු කර ඇති බවත්, එම ණය පියවා මාස තුනක වැඩි බවත්, නමුත් මේවන විට ද පාරිභෝගිකයන්ගෙන් එම රුපියල් 50.00 ක මුදල අය කරමින් පවතින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රජයේ ආර්ථිකය නංවාලීම සඳහා මෙම රජය විසින් ආයතන තුනක් හදුනා ගෙන ඇති බවත්,හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපල හා වරාය නගරය යන ස්ථාන තුන එම ආයතන තුන බවත්, සුදු අලියෙක් ලෙස දැකපු එම ආයතන ප්‍රවර්ධනය කිරීමට මැදිහත්වීම පිළිබඳ ස්තුතිවන්ත වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ අභාවය තමාට සහභාගිවීමට නොහැකි වූ බවත්, එහෙත් එතුමා වෙනුවෙන් මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා සඳහන් කළ ඇහැලිගොඩ දම්මුල්ල මාර්ගයේ ඇරැපොල සිට දම්මුල්ල දක්වා මේවනවිට විශාල සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වීමට තිබෙන බවත්, එතුමා සඳහන් කළ මාර්ග කොටස ගෝනමල්දෙනිය ට්‍රාන්ස්ෆෝමරය අසල සිට දනාගලවත්ත දක්වා වූ කොටසට දිට්වා ආධාර යටතේ කෝටි එකයි ලක්ෂ තිහක ප්‍රතිපාදනයක් වෙන්වී ඇතිබවත් ඇස්තමේන්තුව මේ සඳහා යොමු කර ඇති බවත්, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් තමන් සතුටු වන බවත්,ඊට අමතරව අබලන් තත්ත්වයේ පැවති එක් බෝක්කුවක් මේවන විට සංවර්ධනය වෙමින් පවතින බවත්, අබලන් තත්ත්වයේ පවතින තවත් එක් බෝක්කුවක් දින කිහිපයකට පෙර විධායක ඉන්ජිනේරු ආයතනය විසින් මැනිම් කටයුතු සිදු කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා සඳහන් කළ කාරනා සම්බන්ධව මෙවන විට විසඳුම් ලැබී ඇති බව ඉතාම සතුටින් ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

සභික මණ්ඩලයේ වටිස්ඇප් සමුහය සම්බන්ධව විශේෂයෙන් සඳහනක් කළ යුතු බවත්, තමන් ඒ හරහා අදහස් ප්‍රකාශ කරන ප්‍රමාණය අඩු බවත්, මීන් පෙර ගරු දිලින් මන්ත්‍රිතුමා විසින් පෙන්වා දුන් අඩු පාඩුවට තමා විසින් පිළිතුරු සැපයූ බවත්, මෙම සමුහය සම්බන්ධව සභා ලේකම් විසින් වැදගත් අදහසක් යොමු කර තිබූ බවත්, එම සමුහය තුළ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සෑම දෙනාම මීට වඩා විනයානුකූලව හැසිරීම කළ යුතු බවත්, ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රිතුමන්ලා මන්ත්‍රිතුමියන්ලා මෙන්ම සභා ලේකම්තුමා ඇතුළු සභාවේ නිලධාරීන්ද මෙහි සිටින බවත්, එම නිසා අනවශ්‍ය කාරණා නොදමා අත්‍යවශ්‍ය කාරණා පමණක් යොමු කිරීම සිදු කළ යුතු බවත්, ඒ තුලින් සියලු දෙනාගෙම ගේරවය ආරක්ෂා වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය ප.ව 12.55 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය කළ ප්‍රකාශයන්ට යම් පැහැදිලි කිරීම් කිරීමට අවශ්‍ය බවත්, විලේගොඩ හා බෝපැත්ත මාර් දෙකෙහිම මේවන විට විදුලි පහන් දැල් වෙන බවත්, සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් විදුලි බලමණ්ඩලයේ බකට් කෙ ගෙනවිත් එම වදුලි පහන් සවි කර දීම පිලිබඳව ගරු සභාපතිතුමාව විශේෂ ස්තුතිය ප්‍රකාශ කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා එය දල්වන වෙලාව හා එය නිවා දමන වේලාව අතර ප්‍රශ්නය තිබෙන බව ප්‍රකාශ කළ බවත්, එහි ප්‍රශ්නයක් තිබෙන බව තමාද පිලි ගන්නා බවත්, ඒ සඳහා ටයිමර් සවි කර නොමැති බවත්, ටයිමර් විදුලි බලමණ්ඩලයට ගෙනවිත් දුන්න ද විදුලි බල මණ්ඩලය විසින් එම කාර්ය තවම සිදු කර නොමැති බවත්, මේ නිසා සභාවේ සේවකයෙක් යොදවා විදුලි පහන් දැල්වීම සිදු කරන බවත්, නිවා දැමීම හැකි තරම් ඉක්මනින් සිදු කරන ලෙස දන්වා ඇති බවත්, දින දෙක තුනක් නිවා දැමීම උදැසන 9 විතර වූ බවත්, එහි වැරැද්දක් තිබෙන බව පිළි ගන්නා බවත්, එම විදුලි පහන් දැල් වීම පිළිබඳව විශේෂයෙන් ම ස්තුතිවන්ත වන බවත්,ටයිමර් සවි කළ පසු අදුර වැටෙන විට දැල්වීම හා එළිය වැටෙන විට නිවීම සිදුවන බවත් එහි ගැටලුවක් නොමැති බවත්, ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ වගේම සකස් කරන්නට යෙදුණු කාණු පද්ධතියෙහි බෝක්කුව දාලා නෑ කියා ප්‍රකාශ කරනවා.ඇත්තට ම ඒ බෝක්කුව අවුරුදු විසි ගණනක් තිස්සේ නොදැක තීබීම සම්බන්ධව තමා දුක් වන බවත්, පළාත් සභාව විසින් එවකට කළ එකක් බවත්, එය අවිධිමත් ආකාරයෙන් සිදු එල් අකුරක ආකාරයට කර ඇති බවත්, එයයපස්වලින් වැසී තිබුණ හෙයින් නොපෙනුනු බවත්, එහි පස් දැන් ඉවත් කර ඇති බවත්, තමා ඉදිරි යෝජනාවලදී එය සකස් කිරීමට කටයුතු කරන බවත්, ජලය බැස යාමට කාණු පද්ධතිය කෙලින් කර සකසා දෙන බවත්, එවැනි අඩුපාඩු පෙන්වා දීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
පාසල් දරුවන් වෙනුවෙන් රණමයුර ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කළ වොලිබෝල් තරගාවලියකට සහභාගි වූ බවත්, ඒ සඳහා ගරු හිරිපිටිය මන්ත්‍රිතුමා ද සහභාගි වූ බවත්, එම පැවිලියන් එකේ සංවර්ධනය කළ යුතු කොටසක් තිබෙන බවත්, එය සකසා දෙන ලෙස එම දරුවන් විසින් ඉල්ලීමක් කළ බවත්, එය රුපියල් ලක්ෂ දෙකක් පමණ මුදලක් යොදවා සිදු කළ හැකි බවත්, පැතිබැම්මක් යොදා එම කටයුත්ත ද කර දෙන ලෙස ඉල්ලීමක් කරන බවත් ගරු අතුරලිය මන්ත්‍රිතුමාගේ සහෝදරයාගේ අභාවය වෙනුවෙන් ද ශෝකය ප්‍රකාශ කරන බවත්, ඒ වගේ ම කුරුවිට ප්‍රාදේශිය සභා මන්ත්‍රී අජිත් මනම්පේරි මන්ත්‍රිතුමාට ද ශෝකය ප්‍රකාශ කරන බවත් ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය ප.ව 12.5 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පොළ භූමියේ ඉදිවෙන ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වැඩ කටයුතු ආරම්භ වී වැඩ කටයුතු සිදු වන යැයි ජනතාව විසින් බලා සිටින බවත්, ඒ පිළිබඳ නිවරදි තොරතුරක් දී සභාවේ වගකීමක් බවත්, තමා ද මන්ත්‍රිවරයෙක් විදිහට බලන් හිටියේ මේවනවිට එහි කටයුතු ආරම්භ වී මේ වර්ශය අවසන් වීමට එම කටයුතු සිදු කර අවසන් කිරීමට හැකිවෙය යනුවෙන් ලොකු විශ්වාසයක් හා සතුටක් තිබූ බවත්, නමුත් දැන් ඒ පිළිබඳ දුක් වෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නගර 10 සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ගිය අවුරුද්දෙ කෝටි 30 වෙන් වුණ නමුත් දැන් අවුරුද්දෙන් මාස 9 ක් පමණ ගෙවී ගොස් ඇති බවත්, තව මාස 3 ක් පමණක් ඉතිරි වී ඇති බවත්, එම මාස තුන තුළ මෙම කෝටි 30 වියදම් කර ගැනීමට පුළුවන් වේවිද බැරි වේවිදකියා ප්‍රශ්යක් තිබෙන බවත්, එක හදන්න අරන් මේ නගරයට යහපතක්. එය තාම ප්‍රමාද බවත්, ඒ සම්බන්ධව සතුටු විය නොහැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වරිපනම් ගෙවන ජනතාව සභාවට ඉල්ලීම් කිහිපයක් කර ඇති බවත්, ඔවුන්ට ලබා දෙන පහසුකම් සම්බන්ධව ඔවුන් සෑහීමකට පත්වන බව දන්වා තිබෙන බවත්,මේ සම්බන්ධව සභාවෙන් ද විමසීම් කළ බවත්, ඉදිරියේ දී මේ සම්බන්ධව යම් සහන ලබා දීමට කටයුතු කරන බව දන්වමින් ඒ සම්බන්ධව ඔවුන්ට පිළිතුරු යැවීමට කටයුතු කරනවා නම් හොඳ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු වජිර මන්ත්‍රීතුමා රටේ අයවැය වැය ශීර්ෂය පිළිබඳව කරුනු ඉදිරිපත් කළ බවත්, ඒ කරුණු සම්බන්ධව මූලාශ්‍රය විමසුව ද ඔහු විසින් මූලාශ්‍රයක් ඉදිරිපත් නොකළ බවත්,IMF එකෙන් ඉවත් වෙනවා කියපු පුද්ගයොම තමා මේ IMF එක හරහා ගිහින් මේ ජයග්‍රහණ අත් කරගෙන ඇති බවත්, නමුත් හිටපු ජනාධිපතිතුමා වන අතිගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ වැල්පාලමේ ගිහින් ලබා ගත් ජයග්‍රහණ බව මෙහිදී අවධාරණය කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උපසභාපතිතුමා සභා රීති සම්බන්ධව කතා කල බවත්, රීති උපුටා දක්වමින් එතුමාගේ හිතේ තිබූ කාරණාව එතන දී අදහස් කළ බවත්, එහෙම කාරණාවක් නොමැති බවත්, ඒ සම්බන්ධව නැවත අධ්‍යනයක් කර ඒ සම්බන්ධව නැවත දැනුම් දීමට කටයුතු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කුරුවිට ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මැතිතුමාට විපක්ෂ කණ්ඩායමේ ශෝකය ද පළ කිරීමට හැකිනම් එයද පළ කරන ලෙස ඉල්ලා සිටින බවත්, විපක්ෂ කණ්ඩායමේ බලවත් ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා.

බුළුගහපිටිය පාරේ ස්ර්විස් එකට පහළ වංගුවේ විශාල වශයෙන් කුණු දැමීමට පටන් ගෙන ඇති බවත්, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අද දින සභා රැස්වීම සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා, ගරු මන්ත්‍රිවරුන් මන්ත්‍රිවරියන් සියලු දෙනාටමත්, මාධ්‍ය වේදී සියලු දෙනාටත්, සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන් දෙපළටත් ස්තුතිවන්ත වන බවත්,2026.09.08 වන සාමාන්‍ය සභා රැස්වීමේ කටයුතු මේ සමඟ අවසන් කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.09.08 වන දින සාමාන්‍ය සභා රැස්වීම 1.05 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.....මස.....දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.